සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 02 - රසායන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය

04/2/S/Bench 37

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Visit EDUHUB

Scanned with CamScanner

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 02 - රසායන විද්‍යාව

## ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | : | 1 X 50 | = | 50 |
| II පත්‍රය | : | | | |
| A කොටස | : | 100 X 4 | = | 400 |
| B කොටස | : | 150 X 2 | = | 300 |
| C කොටස | : | 150 X 2 | = | 300 |
| **එකතුව** | | | = | 1000 |
| II පත්‍රය – **අවසාන ලකුණු** | | | = | 100 |

**උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම**



Visit EDUHUB
Scanned with CamScanner

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂයය අංකය / பாட இலக்கம: **02**

විෂයය / பாடம்: **Chemistry**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 4 | 31. | 4 | 41. | 1 |
| 02. | 5 | 12. | 2 | 22. | 4 | 32. | 4 | 42. | 1 |
| 03. | 2 | 13. | 5 | 23. | 5 | 33. | 2 | 43. | 2 |
| 04. | 1 | 14. | 4 | 24. | 1 | 34. | 3 | 44. | 5 |
| 05. | 2 | 15. | 5 | 25. | 1 | 35. | 5 | 45. | 1 |
| 06. | 3 | 16. | 2 | 26. | 4 | 36. | 4 | 46. | 4 |
| 07. | 4 | 17. | 2 | 27. | 3 | 37. | 1 | 47. | 1 |
| 08. | 5 | 18. | 5 | 28. | 3 | 38. | 5 | 48. | 1/4 |
| 09. | 3 | 19. | 3 | 29. | 3 OR 4 | 39. | 5 | 49. | 1 |
| 10. | 5 | 20. | 5 | 30. | 2 | 40. | 2 | 50. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50



Visit EDUHUB

Scanned with CamScanner

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

1. (a) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද නැතහොත් **අසත්‍ය** ද යන බව තිත් ඉරි මත සඳහන් කරන්න. හේතු අවශ්‍ය නැත.

(i) කැටායනවල ධ්‍රැවීකරණ බලය සහ ඇනායනවල ධ්‍රැවණශීලිතාව හා සම්බන්ධ නිති, LiIවලට වඩා KBrවල ද්‍රවාංකය ඉහළ බව පුරෝකථනය කරයි. — සත්‍ය වේ

(ii) Beවල ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය ධන අගයක් වේ. — සත්‍ය වේ

(iii) හයිඩ්‍රජන්වල පරමාණුක වර්ණාවලියේ, දෙන ලද ශ්‍රේණියක අනුයාත රේඛා දෙකක් අතර ඇති පරතරය තරංග ආයාම අඩුවන දෙසට ක්‍රමයෙන් අඩු වේ. — සත්‍ය වේ

(iv) එකම ප්‍රවේගයෙන් ගමන් කරන විට $N_2$ අණුවක් හා සම්බන්ධ ඩි බ්‍රෝග්ලි තරංග ආයාමය $O_2$ අණුවෙහි ඩි බ්‍රෝග්ලි තරංග ආයාමයට වඩා කුඩා වේ. — අසත්‍ය වේ

(v) Cවල සංයුජතා ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණය ($Z_{සඵල}$) Nවල සංයුජතා ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණයට වඩා වැඩි ය. — අසත්‍ය වේ


(vi) කාබොනික් අම්ලයේ ($H_2CO_3$) සියලුම C–O බන්ධන දිගින් සමාන ය. — අසත්‍ය වේ


(ලකුණු 04 x 6 = ලකුණු 24)

සැ. යු.: සත්‍ය වේ ✓ හෝ T, අසත්‍ය වේ - x හෝ F පිළිගත හැක.

**1(a): ලකුණු 24**


(b) (i) $Cl_2O_4$ අණුව සඳහා **වඩාත්ම** පිළිගත හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න. එහි සැකිල්ල පහත දක්වා ඇත.





(06)


(ii) ඉහත (i) හි අඳින ලද ව්‍යුහයේ ක්ලෝරීන් පරමාණු දෙකෙහි ඔක්සිකරණ අවස්ථා දෙන්න. ක්ලෝරීන් පරමාණු පහත දක්වා ඇති ආකාරයට සලකුණු කර ඇත.



$Cl^1$ ..+I.. (+1), $Cl^2$ +VII.. (+7)


(01 + 01)


(iii) $N_2O_2^{2-}$ අයනය සඳහා **වඩාත්ම** ස්ථායි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය පහත දක්වා ඇත. මෙම අයනය සඳහා තවත් ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) දෙකක් අඳින්න.



(02) (02)

(iv) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.





| | | $N^1$ | $C^2$ | $C^3$ | $N^4$ |
|---|---|---|---|---|---|
| I | පරමාණුව වටා VSEPR යුගල් | 3 | 3 | 2 | 2 |
| II | පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | තලීය ත්‍රිකෝණාකාර | තලීය ත්‍රිකෝණාකාර | රේඛීය | රේඛීය |
| III | පරමාණුව වටා හැඩය | කෝණික/V | තලීය ත්‍රිකෝණාකාර | රේඛීය | රේඛීය |
| IV | පරමාණුවේ මුහුම්කරණය | $sp^2$ | $sp^2$ | sp | sp |

(ලකුණු 01 x 16 = ලකුණු 16)



Visit EDUHUB

Scanned with CamScanner

- කොටස් (v) සිට (viii), ඉහත (iv) කොටසෙහි දෙන ලද ලුවිස් තිත්-ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iv) කොටසෙහි ආකාරයටම වේ.

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\sigma$ බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක/මුහුම් කාක්ෂික හඳුනාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | $N^1$—F | $N^1$ | $sp^2$ | F | 2p or $sp^3$ |
| II. | $N^1$—$C^2$ | $N^1$ | $sp^2$ | $C^2$ | $sp^2$ |
| III. | $C^2$—H | $C^2$ | $sp^2$ | H | 1s |
| IV. | $C^2$—$C^3$ | $C^2$ | $sp^2$ | $C^3$ | sp |
| V. | $C^3$—$N^4$ | $C^3$ | sp | $N^4$ | sp |
| VI. | $N^4$—O | $N^4$ | sp | O | 2p or $sp^3$ |

(ලකුණු 01 x 12 = ලකුණු 12)

(vi) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\pi$ බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | $N^1$—$C^2$ | $N^1$ | 2p | $C^2$ | 2p |
| II. | $C^3$—$N^4$ | $C^3$ | 2p | $N^4$ | 2p |
| | | $C^3$ | 2p | $N^4$ | 2p |

(ලකුණු 01 x 6 = ලකුණු 06)

(vii) $N^1, C^2, C^3$ සහ $N^4$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න.

$N^1$ (118° ± 1) $C^2$ (120° ± 1) $C^3$ (180° ± 1) $N^4$ (180° ± 1) (ලකුණු 01 x 4 = ලකුණු 04)

(viii) $N^1, C^2, C^3$ සහ $N^4$ පරමාණු විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙළට සකසන්න.

$C^2 < C^3 < N^1 < N^4$ (04)

**1(b): ලකුණු 54**

(c) (i) ලේසරයක් (Laser) තරංග ආයාමය 695 nm වන ෆෝටෝන විමෝචනය කරයි.

I. මෙම ෆෝටෝන අයත් වන්නේ විද්‍යුත් චුම්බක වර්ණාවලියේ කුමන කලාපයට ද?

දෘෂ්‍ය කලාපය (02)

II. මෙම ෆෝටෝන මවුලයක ශක්තිය kJ $mol^{-1}$ වලින් ගණනය කරන්න.

ආලෝකයේ ප්‍රවේගය $c = 3.00 \times 10^8$ m $s^{-1}$ ප්ලාන්ක් නියතය $h = 6.63 \times 10^{-34}$ J s

ෆෝටෝනයක ශක්තිය (E) $= h\nu$

$= h\frac{c}{\lambda}$ (01)

ෆෝටෝන මවුලයක ශක්තිය $= h\frac{c}{\lambda} \times N_A$ (01)

($N_A$ = ඇවගාඩ්රෝ නියතය)

එබැවින්, ෆෝටෝන මවුලයක ශක්තිය

$= \frac{6.63 \times 10^{-34} \text{ (J s)} \times 3.00 \times 10^8 \text{ (m s}^{-1}) \times 6.022 \times 10^{23} \text{ (mol}^{-1})}{695 \times 10^{-9} \text{ (m)}}$ (03 +01)

$= 172$ kJ $mol^{-1}$ (02)

සැ.යු. - පියවර එක්කර ඇත්නම් ලකුණු ප්‍රදානය කළ හැකිය..

$h = 6.626 \times 10^{-34}$ (J s) පිළිගනු ලැබේ.

(ii) $AX_3$ යන සූත්‍රය ඇති අණුවක A−X $\sigma$ බන්ධන **තුනක්** අඩංගු ය. මෙහි A සහ X මූලද්‍රව්‍යවල සංකේත නිරූපණය කරන අතර, A මධ්‍ය පරමාණුව වේ.

පහත දී ඇති I සහ II හිදී $AX_3$ සඳහා තිබිය හැකි අණුක හැඩය/හැඩයන් නම් කරන්න.

I. $AX_3$ ධ්‍රැවීය නම් T හැඩය, ත්‍රිකෝණාකාර පිරමීඩීය හෝ පිරමීඩීය (02 + 02)

II. $AX_3$ නිර්ධ්‍රැවීය නම් තලීය ත්‍රිකෝණාකාර (02)

III. ඉහත I හා II යටතේ ඔබ සඳහන් කර ඇති හැඩවලට **එක්** උදාහරණයක් බැගින් දෙන්න. (සැ.යු. : අණුක සූත්‍ර අවශ්‍ය වේ.)

$AX_3$ ධ්‍රැවීය T හැඩය – $ClF_3$, $BrF_3$, $IF_3$ (ඕනෑම එකක්) (02)

ත්‍රිකෝණාකාර පිරමීඩීය – $NH_3$, $PH_3$, $NCl_3$, $PCl_3$ (ඕනෑම එකක්) (02)

$AX_3$ නිර්ධ්‍රැවීය $BF_3$, $BCl_3$, $BBr_3$, $BI_3$, $AlCl_3$ (ඕනෑම එකක්) (02)

සැ. යු.: හැඩය වැරදි නම් උදාහරණ සඳහා ලකුණු ප්‍රදානය නොකරන්න.
III හි උදාහරණ වලට ලකුණු ප්‍රදානය කිරීම සඳහා හැඩය සඳහන් කර තිබිය යුතුය.

**1(c): ලකුණු 22**



Visit EDUHUB
Scanned with CamScanner

**2.** පහත දී ඇති ප්‍රශ්න [(*a*) – (*d*)] **A, B, C** හා **D** ලෙස නම් කර ඇති මූලද්‍රව්‍ය/විශේෂ (ප්‍රභේද) හා සම්බන්ධය.

(*a*) **A** යනු *s*-ගොනුවේ මූලද්‍රව්‍යයකි. එහි පරමාණුක ක්‍රමාංකය 20 ට අඩු ය. එය ජලය සමග ගිනිගැනීමක් සහිතව ප්‍රබල ලෙස ප්‍රතික්‍රියා කර, වායුවක් පිට කරමින්, ප්‍රබල භාස්මික ද්‍රාවණයක් ලබාදෙයි. **A** වැඩිපුර $O_2(g)$ සමග ප්‍රතික්‍රියා කර සුපර්ඔක්සයිඩය සාදයි. ස්වභාවික ලෝපසක් වන සිල්වයිට්වල **A** හි සංයෝගයක් අඩංගු වේ.

(i) **A** හි රසායනික සංකේතය ලියන්න. ............ K **(05)**

(ii) **A** හි සම්පූර්ණ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න. ............ $1s^22s^22p^63s^23p^64s^1$ **(05)**

(iii) ජලය සමග **A** ප්‍රතික්‍රියා කළ විට පිටවන වායුව නම් කරන්න. ............ හයිඩ්‍රජන් හෝ $H_2$ **(05)**

(iv) පහන්සිළු පරීක්ෂාවේදී **A** ලබාදෙන වර්ණය කුමක් ද? ............ ලයිලැක් (දම් පැහැ) **(05)**

(v) වැඩිපුර $O_2(g)$ සමග **A** හි ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

$K + O_2 \longrightarrow KO_2$ **(05)**

(vi) **A** හි පළමු අයනීකරණ ශක්තිය, ආවර්තිතා වගුවේ එම කාණ්ඩයේම ඊට ඉහළ ආවර්තයේ ඇති මූලද්‍රව්‍යයේ එම අගයට වඩා වැඩි හෝ අඩු වේ ද? ඔබගේ පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න.

අඩුය. **(02)**

කාණ්ඩයේ පහළය යන විට පිටතම අවසාන කවචයේ ඇති ඉලෙක්ට්‍රෝනයට දැනෙන සඵල න්‍යෂ්ඨික ආරෝපනය (හෝ $Z_{eff}$) නොසලකා හැරිය හැක. **(01)**

පරමාණුවේ විශාලත්වය වැඩි වේ. **(01)**

එබැවින් පිටත ඇති ඉලෙක්ට්‍රෝන න්‍යෂ්ටියට ඇති ආකර්ශනය අඩු වේ. **(01)**

(vii) සිල්වයිට්වල අඩංගු **A** හි සංයෝගයේ රසායනික සූත්‍රය දෙන්න. ............ KCl **(05)**


**සැ.යු. - (vi) අඩුවේ යයි ලියා ඇත්නම් පමණක් ලකුණු ප්‍රදානය කරන්න**

**2(a): ලකුණු 35**

(*b*) **B** යනු **X** හා **Y** යන මූලද්‍රව්‍ය දෙක පමණක්, පිළිවෙළින් 2:3 අනුපාතයෙන් අඩංගු ඇනායනයකි. මෙම **X** හා **Y** යන මූලද්‍රව්‍ය දෙකම ආවර්තිතා වගුවේ එකම කාණ්ඩයට අයත් *p*-ගොනුවේ මූලද්‍රව්‍ය වේ. එක් එක් මූලද්‍රව්‍යයේ පරමාණුක ක්‍රමාංකය 20 ට වඩා අඩු වේ. **X** හි විද්‍යුත් සෘණතාව **Y** හි විද්‍යුත් සෘණතාවට වඩා අඩු ය. **X** උණු සාන්ද්‍ර සල්ෆියුරික් අම්ලය සමග ප්‍රතික්‍රියා කළ විට, එක් ඵලයක් ලෙස අවර්ණ, කටුක ගඳක් සහිත වායුවක් පිට වේ.

(i) **B** හි රසායනික සූත්‍රය, ආරෝපණය ද ඇතුළත්ව, ලියන්න. ............ $S_2O_3^{2-}$ **(05)**

(ii) **B** හි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න.



**(05)**

(iii) **B** හි මධ්‍ය පරමාණුවේ ඔක්සිකරණ අවස්ථාව දෙන්න. ............ +4 **(05)**

(iv) **B** හඳුනාගැනීම සඳහා රසායනික පරීක්ෂාවක් දෙන්න. (**සැ.යු.**: නිරීක්ෂණය/නිරීක්ෂණ ද අවශ්‍ය වේ.)

| පරීක්ෂාව | නිරීක්ෂණය |
|---|---|
| 1. dil. $H_2SO_4$ එක් කිරීම (02) | කටුක ගඳක් සහිත අවර්ණ වායුවක් හා (01) හා කිලිමය සල්ෆර් අවක්ෂේපය (හෝ කිරි පැහැති ද්‍රාවණය) (02) |
| 2. $Pb(OAc)_2$ එක් කිරීම (02) | රත් කල විට කළු පැහැයට හැරෙන සුදු අවක්ෂේපයක් (03) |
| 3. $AgNO_3$ එක් කිරීම (02) | රත් කල විට/ කල් ගත වීමේදී කළු පැහැයට හැරෙන සුදු අවක්ෂේපයක් (03) |

ඉහත ඕනෑම එකක්

**සැ.යු.: නිරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමට පරීක්ෂාව නිවැරදි විය යුතුය.**

(v) **A** කැටායනය හා **B** ඇනායනය ලෙස ඇති සංයෝගයේ රසායනික සූත්‍රය ලියන්න. **(05)**

$K_2S_2O_3$

**2(b): ලකුණු 25**

(c) **C** යනු ඔක්සිකාරකයකි. එය 1:1:3 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය තුනකින් සමන්විත වේ. **C** වල එක් මූලද්‍රව්‍යයක් **A** වේ. අනෙක් මූලද්‍රව්‍ය දෙක ආවර්තිතා වගුවේ *p*-ගොනුවට අයත් වේ. මෙම මූලද්‍රව්‍ය දෙකෙන් එකක් **B** හි ද අඩංගු වේ. මෙයින් එක් මූලද්‍රව්‍යයක ඇනායනය සහ $Ag^+$ අතර සෑදෙන ලවණය කහ පැහැති වන අතර, එය සාන්ද්‍ර ඇමෝනියා ද්‍රාවණයක අද්‍රාව්‍ය වේ.

**C** හි රසායනික සූත්‍රය ලියන්න. $KIO_3$ **(10)**

**2(c): ලකුණු 10**

**සැ.යු.: (b) (v) සහ (c) සඳහා ලකුණු ලබා දීමට සම්පූර්ණ රසායනික සූත්‍රය අවශ්‍ය වේ.**



Visit EDUHUB
Scanned with CamScanner

(*d*) **D** යනු මූලද්‍රව්‍ය දෙකකින් සමන්විත සංයෝගයකි. මෙම මූලද්‍රව්‍ය දෙකම **C** හි ද ඇත.

(i) ආම්ලික මාධ්‍යයේදී වැඩිපුර **D**(aq) සමග **C**(aq) මිශ්‍ර කළ විට, රතු-දුඹුරු ද්‍රාවණයක් ලැබේ. **(05)**

I. **D** හඳුනාගන්න. D = KI

II. මෙහිදී සිදුවන ප්‍රතික්‍රියාව සඳහා තුලිත අයනික සමීකරණය ලියන්න.

$IO_3^- + 5I^- + 6H^+ \longrightarrow 3I_2 + 3H_2O$ or $IO_3^- + 8I^- + 6H^+ \longrightarrow 3I_3^- + 3H_2O$ **(10)**

(ii) ඉහත (i) හි ලැබෙන රතු-දුඹුරු ද්‍රාවණයට, **B** අඩංගු ද්‍රාවණයෙන් වැඩිපුර එක් කිරීමේදී, රතු-දුඹුරු ද්‍රාවණය අවර්ණ වේ. මෙහි සිදුවන ප්‍රතික්‍රියාව සඳහා තුලිත අයනික සමීකරණය ලියන්න.

$I_2 + 2S_2O_3^{2-} \longrightarrow S_4O_6^{2-} + 2I^-$ or $I_3^- + 2S_2O_3^{2-} \longrightarrow S_4O_6^{2-} + 3I^-$ **(05)**


(iii) ඉහත (i) හා (ii) හි සිදුවන ප්‍රතික්‍රියා උපයෝගී කර ගනිමින් **B** අඩංගු ද්‍රාවණයක සාන්ද්‍රණය පරිමාමිතික විශ්ලේෂණය මගින් නිර්ණය කළ හැක. මෙහිදී භාවිත කළ හැකි දර්ශකයක් සඳහන් කර, අන්ත ලක්ෂ්‍යයේදී අපේක්ෂිත වර්ණ විපර්යාසය දෙන්න.

දර්ශකය : පිෂ්ඨය **(05)**

වර්ණ විපර්යාසය : නිල් / තද නිල්/ නිල් - දම් සිට අවර්ණ **(05)**

**2(d):ලකුණු 30**

3. (*a*) **X** හා **Y** යනු පරිපූර්ණ ද්‍රාවණයක් සාදන වාෂ්පශීලී ද්‍රව දෙකකි. **X** හා **Y** අඩංගු පද්ධතියක් සඳහා උෂ්ණත්ව-සංයුති කලාප සටහන ($1.0 \times 10^5$ Pa පීඩනයකදී) පහත දී ඇත.




- (i) සිට (v) දක්වා කොටස් දී ඇති කලාප සටහන මත පදනම් වේ.

(i) පහත දී ඇති ප්‍රදේශ කලාප සටහන මත P, Q, R අක්ෂර යෙදීමෙන් දක්වන්න.

P – ද්‍රව කලාපය පමණක් පවතින ප්‍රදේශය

Q – වාෂ්ප කලාපය පමණක් පවතින ප්‍රදේශය

R – ද්‍රව කලාපය හා වාෂ්ප කලාපය සමතුලිතව ඇති ප්‍රදේශය

සැ.යු.: අර්ථ දැක්වීමකින් තොරව වෙනත් සංකේත භාවිත කර ඇත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න

(ii) සංශුද්ධ **X** හා සංශුද්ධ **Y** හි තාපාංක දෙන්න.

**X** 60 °C **Y** 120 °C

**(02+01) x 2**

(iii) **X** හි 40 mol% අඩංගු **X** හා **Y** ද්‍රව මිශ්‍රණයක් නැටීමට ආරම්භ වන උෂ්ණත්වය කුමක් ද?

80 °C **(02+01)**

(iv) **X** හි 60 mol% අඩංගු **X** හා **Y** මිශ්‍රණයක් සම්පූර්ණයෙන්ම වාෂ්ප බවට පත්වන අවම උෂ්ණත්වය කුමක් ද?

100 °C **(02+01)**



Visit EDUHUB
Scanned with CamScanner

(v) උෂ්ණත්වය 100 °C හිදී **X** හි සංතෘප්ත වාෂ්ප පීඩනය ගණනය කරන්න.

100 °C හිදී ද්‍රවකලාපයේ X හි මවුලභාගය 15% හා වායු කලාපයේ X හි මවුලභාගය 60% වේ.
රවුල්ට් නියමය භාවිතයෙන්

$P_X^g = P_X^0\, x_X^l$ **(03)**

$P_X^g = P^{total} x_X^g$ **(03)**

එම නිසා, $P_X^0 = \frac{P^{total} x_X^g}{x_X^l}$ **(03)**

$P_X^0 = \frac{1\times10^5\, Pa \times 60}{15}$ **(05+01)**

$P_X^0 = 4.0\ \times 10^5\ Pa$ **(04+01)**

සැ.යු.: පියවර එකතු කළ හැක.

(vi) වෙනත් පරීක්ෂණයකදී **සංවෘත දෘඪ** බඳුනක් තුළ **X** හා **Y** අඩංගු මිශ්‍රණයක් T උෂ්ණත්වයේදී සමතුලිතතාවට එළඹීමට ඉඩහරින ලදී. එවිට වාෂ්ප කලාපය සමග සමතුලිතව පවතින ද්‍රව කලාපයෙහි **X** 0.10 mol හා **Y** 0.10 mol අඩංගු බව සොයාගන්නා ලදී. මෙම උෂ්ණත්වයේදී **X** හා **Y** හි සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙළින් $4.0 \times 10^5$ Pa හා $2.0 \times 10^5$ Pa වේ. රවුල් නියමය භාවිතයෙන් **X** හා **Y** හි ආංශික පීඩන ගණනය කරන්න.

$P_X = \frac{0.1\, mol \times 4.0\times10^5\ Pa}{0.1\, mol + 0.1\, mol}$ **(02+01)**

$P_X = 2.0\ \times 10^5 Pa$ **(02+01)**

$P_Y = \frac{0.1\, mol \times 2.0\times10^5\ Pa}{0.1\, mol + 0.1\, mol}$ **(02+01)**

$P_Y = 1.0\ \times 10^5 Pa$ **(02+01)**

**3(a) ලකුණු 50**

(b) ජලීය ඇසිටික් අම්ල ද්‍රාවණයක (**Z** ද්‍රාවණය) සාන්ද්‍රණය, ජලීය NaOH ද්‍රාවණයක් සමග අනුමාපනයෙන් නිර්ණය කරන ලදී. **Z** ද්‍රාවණයෙහි 12.50 $cm^3$ පරිමාවක් සඳහා අන්ත ලක්ෂ්‍යයට ළඟා වීමට සාන්ද්‍රණය 0.050 mol $dm^{-3}$ වූ NaOH ද්‍රාවණයෙන් 25.00 $cm^3$ ක් අවශ්‍ය විය.

(i) **Z** ද්‍රාවණයෙහි ඇසිටික් අම්ල සාන්ද්‍රණය ගණනය කරන්න.

$[CH_3COOH(aq)] = \frac{25.00\, cm^3 \times 0.05\, mol\, dm^{-3}}{12.50\, cm^3}$ **(02+01)**

$= 0.10\, mol\, dm^{-3}$ **(02+01)**

(ii) **Z** ද්‍රාවණයෙහි pH අගය ගණනය කරන්න. පරීක්ෂණය සිදු කරන ලද උෂ්ණත්වයේදී ඇසිටික් අම්ලයෙහි අම්ල විඝටන නියතය ($K_a$) $1.80 \times 10^{-5}$ mol $dm^{-3}$ වේ.

$CH_3COOH(aq) \rightleftharpoons CH_3COO^-(aq) + H^+(aq)$ **(02)**

හෝ

$CH_3COOH(aq) + H_2O(l) \rightleftharpoons CH_3COO^-(aq) + H_3O^+(aq)$

ඇසිටික් අම්ලයෙහි ආරම්භක සාන්ද්‍රණය = C

විඝටනය වූ භාගය = α (හෝ විඝටනය වූ ප්‍රමාණය = x )

**සැ.යු. $K_a$ සඳහා භෞතික අවස්ථා අවශ්‍ය වේ.**

$K_a = \frac{[H^+(aq)][CH_3COO^-(aq)]}{[CH_3COOH(aq)]}$ හෝ $K_a = \frac{[H_3O^+(aq)][CH_3COO^-(aq)]}{[CH_3COOH(aq)]}$ **(02)**

$K_a = \frac{C\alpha\, C\alpha}{C(1-\alpha)}$ හෝ $K_a = \frac{x^2}{C-x}$ **(02)**

[ $K_a = \frac{C\alpha\, C\alpha}{C(1-\alpha)}$ හෝ $K_a = \frac{x^2}{C-x}$ ලියා නැති නමුත් ගණනය නිවැරදිව කර ඇත්නම් ගණනය සඳහා ලකුණු 02 ප්‍රදානය කරන්න.]

විඝටනය වූ භාගය ඉතා කුඩා බැවින් (හෝ α<<1) හෝ x<< c **(02)**



Visit EDUHUB

Scanned with CamScanner

pH ගණනය කිරීම
(භෞතික අවස්ථා දී නැතත් ලකුණු අඩු නොකරන්න)

$[H^+(aq)] = \sqrt{K_a C}$

$[H^+(aq)] = \sqrt{1.80 \times 10^{-5}\, mol\, dm^{-3} \times 0.1\, mol\, dm^{-3}}$ **(02)**

$[H^+(aq)] = 0.00134\, mol\, dm^{-3}$ **(02)**

$pH = -\log\left[\frac{H_3O^+(aq)}{1.0\, mol\, dm^{-3}}\right]$ හෝ $pH = -\log\left[\frac{H^+(aq)}{1.0\, mol\, dm^{-3}}\right]$ **(02)**

හෝ $pH = -log[H^+(aq)]$ හෝ $pH = -log[H_3O^+(aq)]$

$pH = 2.87$ **(02)**

---

pH ගණනය සඳහා විකල්ප පිළිතුර
හෙන්ඩර්සන් සමීකරණය භාවිතයෙන්
(භෞතික අවස්ථා දී නැතත් ලකුණු අඩු නොකරන්න)

$-\log[H^+(aq)] = 1/2(-\log(K_a c))$ **(02)**

$pH = 1/2(-\log(1.8 \times 10^{-5} \times 0.1)$ **(04)**

$pH = 2.87$ **(02)**

---

(iii) **Z** ද්‍රාවණයෙහි තවත් කොටසකට ($100.00\ cm^3$) සංශුද්ධ ඝන NaOH 0.200 g එකතු කර දියකරන ලදී. ද්‍රාවණ පරිමාව හා උෂ්ණත්වය වෙනස් නොවන බව උපකල්පනය කරමින් මෙම ද්‍රාවණයෙහි pH අගය ගණනය කරන්න.
[සාපේක්ෂ පරමාණුක ස්කන්ධය: Na = 23, O = 16, H = 1]

ද්‍රාවණයෙහි $100.00\ cm^3$ හි ඇති $CH_3COOH$ ප්‍රමාණය = $1.0 \times 10^{-2}$ mol **(02)**

එකතු කරන ලද NaOH ප්‍රමාණය = 0.005 mol **(02)**

මාධ්‍යයේ ඉතිරි වී ඇති $CH_3COOH$ ප්‍රමාණය (සමග ප්‍රතික්‍රියා කල පසු NaOH) = $5.00 \times 10^{-3}$ mol **(02)**

එබැවින් ද්‍රාවණයෙහි,
(භෞතික අවස්ථා සඳහන්කර නැතත් ලකුණු අඩු නොකරන්න)

$[CH_3COOH(aq)] = 0.05\ mol\ dm^{-3}$ **(02)**

$[CH_3COONa(aq)] = 0.05\ mol\ dm^{-3}$ **(02)**

-----------------------------------------

pH ගණනය කිරීම
(භෞතික අවස්ථා සඳහන් කර නැතත් ලකුණු අඩු නොකරන්න)

$[H^+(aq)] = \frac{K_a\,[CH_3COOH(aq)]}{[CH_3COO^-(aq)]}$ **(02)**

$[H^+(aq)] = \frac{1.80 \times 10^{5}\, mol\, dm^{-3} \times 0.050\, mol\, dm^{-3}}{0.050\, mol\, dm^{-3}}$ **(02)**

$[H^+(aq)] = 1.80 \times 10^{-5}\, mol\, dm^{-3}$

$pH = 4.74$ **(02)**



Visit EDUHUB

Scanned with CamScanner

pH ගණනය සඳහා විකල්ප පිළිතුර
(භෞතික අවස්ථා දී නැතත් ලකුණු අඩු නොකරන්න)

$pH = pK_a + \log [\frac{[CH_3COO^-(aq)]}{[CH_3COOH(aq)]}$ (02)

$pH = -\log (1.8 \times 10^{-5}) + \log [\frac{[0.05]}{[0.05]}$ (02)

$pH = 4.74$ (02)

(iv) ඉහත (iii) හි විස්තර කරන ලද ද්‍රාවණය ස්වාරක්ෂක ද්‍රාවණයක් ලෙස හැසිරෙයි ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

ඉහත (iii) හි සඳහන් ද්‍රාවණය ස්වාරක්ෂක ද්‍රාවණයක් ලෙස ක්‍රියා කරයි. (02)
ද්‍රාවණයෙහි දුබල අම්ලයක් හා එහි සංයුග්මක භස්මයෙහි සෝඩියම් ලවණය අඩංගු වේ. (02+02)

(v) වෙනත් පරීක්ෂණයකදී Z ද්‍රාවණයෙහි 100.00 $cm^3$ පරිමාවක සංශුද්ධ ඝන NaOH 0.800 g දිය කරන ලදී. මෙම ද්‍රාවණය ස්වාරක්ෂක ද්‍රාවණයක් ලෙස ක්‍රියාකරයි ද? සුදුසු ගණනය කිරීමක් මගින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. ද්‍රාවණයේ පරිමාව හා උෂ්ණත්වය වෙනස් නොවන බව උපකල්පනය කරන්න.

100.00 $cm^3$ හි අඩංගු $CH_3COOH$ ප්‍රමාණය = 0.01 mol

එකතු කරන ලද NaOH ප්‍රමාණය = 0.02 mol (02)
ද්‍රාවණයෙහි $CH_3COOH$ අඩංගු නොවේ.(හෝ $CH_3COOH$ සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කර ඇත) (02)
ද්‍රාවණය ස්වාරක්ෂක ද්‍රාවණයක් ලෙස ක්‍රියා නොකරයි. (02)

**3(b) ලකුණු 50**




Visit EDUHUB
Scanned with CamScanner


**4.** (*a*) **A, B** සහ **C** යනු අණුක සූත්‍රය $C_5H_{11}Br$ සහිත ව්‍යුහ සමාවයවික වේ. මෙම සමාවයවික තුන අතුරෙන්, **B** පමණක් ප්‍රකාශ සමාවයවිකතාවය පෙන්වයි. **A** සහ **C** එකිනෙකෙහි ස්ථාන සමාවයවික වේ.

**A, B** සහ **C** ජලීය NaOH සමග වෙන වෙනම ප්‍රතික්‍රියා කළ විට අණුක සූත්‍රය $C_5H_{12}O$ වන, **D, E** සහ **F** සංයෝග පිළිවෙළින් ලබාදුනි. **D, E** සහ **F** වෙන වෙනම PCC සමග පිරියම් කරන ලදී. PCC සමග **F** ප්‍රතික්‍රියා නොකළේ ය. PCC සමග **D** සහ **E** ප්‍රතික්‍රියා කර පිළිවෙළින් **G** සහ **H** ලබාදුනි. **G** සහ **H** සංයෝග දෙකම, 2,4–ඩයිනයිට්‍රොෆෙනිල්හයිඩ්‍රසීන් (2,4–DNP) සමග වර්ණවත් අවක්ෂේපද, ඇමෝනීය $AgNO_3$ සමග රිදී කැඩපත් ද ලබාදුනි.


**A, B, C, D, E, F, G** සහ **H** වල ව්‍යුහයන් පහත දී ඇති කොටු තුළ අඳින්න.





**A**





**B**





**C**





**D**





**E**




**F**




**G**




**H**

**4(a): ලකුණු 07 × 8 = ලකුණු**



Visit EDUHUB


Scanned with CamScanner

(b) පහත දක්වා ඇති ප්‍රතික්‍රියාවල **I, J, K** සහ **L** ඵලවල ව්‍යුහයන් දී ඇති කොටු තුළ අඳින්න.

(i) $CH_3COCH_3$ —(1) $CH_3MgBr$ (වැඩිපුර)/වියළි ඊතර් ; (2) $H^+/H_2O$ → **I**: $CH_3C(OH)(CH_3)CH_3$

(ii) $C_2H_5C\equiv CH$ —තනුක $H_2SO_4/Hg^{2+}$ → **J**: $C_2H_5COCH_3$


(iii) $CH_3COCH_3$ —(1) ජලීය NaOH ; (2) $H^+/\Delta$ → **K**: $CH_3C(CH_3)=CHCOCH_3$

(iv) 


**L**

4 (b): ලකුණු 06 × 4 = ලකුණු 24

(c) $CH_3CH=CHCH_3$ හා $Br_2/CCl_4$ අතර ප්‍රතික්‍රියාව සඳහා යාන්ත්‍රණය සහ සෑදෙන ඵලයෙහි ව්‍යුහය දෙන්න.




(02) $Br_2$ ධ්‍රැවීකරණය සඳහා

4 (c): ලකුණු 20



Visit EDUHUB
Scanned with CamScanner

5. (*a*) (i) රේචනය කරන ලද සංවෘත දෘඪ බඳුනක් තුළට $CH_4$, $C_2H_6$ හා වැඩිපුර $O_2$ අඩංගු වායු මිශ්‍රණයක් ඇතුළු කරන ලදී. බඳුනෙහි පරිමාව $8.314 \times 10^{-3}$ $m^3$ විය. 400 K හිදී බඳුනේ පීඩනය $4.80 \times 10^6$ Pa විය. බඳුන තුළ ඇති වායූන්ගේ මුළු මවුල සංඛ්‍යාව ගණනය කරන්න. සියලුම වායූන් පරිපූර්ණ ලෙස හැසිරෙන බව සහ මෙම උෂ්ණත්වයේදී ප්‍රතික්‍රියාවක් සිදු නොවන බව උපකල්පනය කරන්න.

pV=nRT භාවිතයෙන් (05)

400K හිදී $n_1 = \frac{4.8\times10^6 Pa\ 8.314\times10^{-3} m^3}{8.314\ J\ mol^{-1} K^{-1}\ 400K}$ (04+01)

$n_1 = 12.0\ mol$ හෝ 12.0 (05)

(ii) බඳුනෙහි උෂ්ණත්වය 800 K දක්වා වැඩි කිරීමෙන් බඳුන තුළ ඇති සියලුම හයිඩ්‍රොකාබන පූර්ණ දහනයට භාජනය කරන ලදී. එම දහන ප්‍රතික්‍රියාවලට පසු 800 K හිදී බඳුනෙහි පීඩනය $1.00 \times 10^7$ Pa විය. දහනයට පසු බඳුන තුළ ඇති වායූන්ගේ මුළු මවුල සංඛ්‍යාව ගණනය කරන්න. මෙම තත්ත්ව යටතේදී $H_2O$ වායුවක් ලෙස පවතින බව උපකල්පනය කරන්න.

800K හිදී $n_2 = \frac{1.0\times10^7 Pa\ 8.314\times10^{-3} m^3}{8.314\ J\ mol^{-1} K^{-1}\ 800K}$ (04+01)

$n_2 = 12.5\ mol$ හෝ 12.5 (05)

(iii) පහත දක්වා ඇති වායූන්හි දහන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ (භෞතික අවස්ථා දක්වමින්, 800 K හි දී) ලියන්න.

I. $CH_4(g)$

II. $C_2H_6(g)$

I. $CH_4(g) + 2\ O_2(g) \rightarrow CO_2(g) + 2\ H_2O(g)$ (05)

II. $2\ C_2H_6(g) + 7\ O_2(g) \rightarrow 4\ CO_2(g) + 6\ H_2O(g)$ (05)

(iv) දහනයට පෙර හා පසු වායු මවුල සංඛ්‍යාවෙහි වෙනසට දායක වන්නේ ඉහත හයිඩ්‍රොකාබන දෙකෙන් එකක් පමණි.
ආරම්භයේදී බඳුන තුළට ඇතුළු කරන ලද මෙම හයිඩ්‍රොකාබනයෙහි මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

දහනයට පෙර හා පසු මුළු මවුල ගණනෙහි වෙනසට දායක වන හයිඩ්‍රොකාබනය වනුයේ $C_2H_6$ (05)

දහනයට පසු වැඩි වූ මවුල සංඛ්‍යාව = 0.5 mol

ආරම්භයේදී ඇතුළු කරන ලද $C_2H_6$ ප්‍රමාණය = 0.5 mol x 2 = 1.0 mol හෝ 1.0 (05)

(v) ඉන්පසු බඳුන 300 K දක්වා සිසිල් කර ජලය ඉවත් කරන ලදී. මෙවිට බඳුනේ පීඩනය $2.10 \times 10^6$ Pa විය. පහත ඒවා ගණනය කරන්න.

ජලය ඉවත් කිරීමෙන් පසු වායු මවුල ගණන

$n_3 = \frac{2.1\times10^6 Pa\ 8.314\times10^{-3} m^3}{8.314\ J\ mol^{-1} K^{-1}\ 300K}$ (04+01)

$n_3 = 7.0\ mol$ හෝ 7.0 (05)

I. සෑදුනු මුළු $H_2O$ මවුල සංඛ්‍යාව

සෑදුනු ජලය ප්‍රමාණය = (12.5 – 7.0) mol = 5.5 mol හෝ 5.5 (05)

II. $C_2H_6$ දහනය මගින් සෑදුනු $H_2O$ මවුල සංඛ්‍යාව

$C_2H_6$ දහනයෙන් සෑදුණු ජලය ප්‍රමාණය = $\frac{6.0\ mol \times 1.0\ mol}{2.0\ mol}$

= 3.0 mol හෝ 3.0 (05)



Visit EDUHUB

Scanned with CamScanner

III. $CH_4$ දහනය මගින් සෑදුනු $H_2O$ මවුල සංඛ්‍යාව

$CH_4$ දහනයෙන් සෑදුනු ජලය ප්‍රමාණය = (5.5 – 3.0 ) mol
= 2.5 mol හෝ 2.5 **(05)**

IV. බඳුන තුළට ආරම්භයේදී ඇතුළු කරන ලද $O_2$ මවුල සංඛ්‍යාව

ආරම්භයේදී ඇතුළු කරන ලද $O_2$ ප්‍රමාණය = 12.0 mol – (1.0 mol + එකතු කරන ලද $CH_4$ ප්‍රමාණය)
= 12.0 mol – (1.0 + 2.5/2) mol
= 9.75 mol හෝ 9.75 **(05)**

**5(a): ලකුණු 75**

(iv) සහ (v) සඳහා විකල්ප පිළිතුර

(iv) දහනයට පෙර හා පසු මවුල ගණනෙහි වෙනසට දායක වූ හයිඩ්‍රොකාබනය = $C_2H_6$ **(05)**

විශේෂයන්හි මවුල ගණන පහත දැක්වෙන පරිදි වේ.

ආරම්භයේදී,

$CH_4 = n_1$ $C_2H_6 = n_2$ හා $O_2 = 2n_1 + 7/2n_2 + n_{excess}$

දහනයට පසු,

$CO_2 = n_1 + 2n_2$ , $H_2O = 2n_1 + 3n_2$ හා $O_2 = n_{excess}$

දහනයට පෙර බඳුන තුල ඇති මවුල ගණන => 12.0 mol = $n_1 + n_2 + 2n_1 + 7/2n_2 + n_{excess}$ --(1)

දහනයට පසු බඳුන තුල ඇති මවුල ගණන => 12.5 mol = $n_1 + 2n_2 + 2n_1 + 3n_2 + n_{excess}$-- (2)

(2)-(1) => $0.5 = 1/2n_2$

ඇතුලු කරන ලද $C_2H_6$ ප්‍රමාණය = $n_2$ = 1.0 mol හෝ 1.0 **(05)**

(v) සෑදුනු මුළු ජලය ප්‍රමාණය = $2n_1 + 3n_2$

ජලය ඉවත් කිරීමෙන් පසු වායු මවුල ගණන

$n_1 + 2n_2 + n_{excess} = \frac{2.1\times10^6\ Pa\ 8.314\times10^{-3} m^3}{8.314\ J\ mol^{-1}K^{-1}\ 300K}$ **(04+01)**

$n_1 + 2n_2 + n_{excess} = 7.0\ mol$ හෝ 7.0 **(05)**

එම නිසා (iv) කොටසෙහි (2) සමීකරණයෙන්

$n_1 = ½(12.5 - (n_1 + 2n_2 + 3n_2 + n_{excess})) = ½(12.5-10.0)mol = 1.25$ mol

(I) සෑදුනු සම්පූර්ණ ජලය ප්‍රමාණය = $2n_1 + 3n_2$ = (2x1.25+3x1.0)mol = 5.5 mol හෝ 5.5 **(05)**

(II) $C_2H_6$ දහනයෙන් සෑදුනු ජලය ප්‍රමාණය = $3n_2$ = 3.0 mol හෝ 3.0 **(05)**

(III) $CH_4$ දහනයෙන් සෑදුනු ජලය ප්‍රමාණය = $2n_1$ = 2.5 mol හෝ 2.5 **(05)**

(IV) ආරම්භයේදී ඇතුලු කරන ලද $O_2$ = (12.0 –(1.25+1.0))mol = 9.75 mol හෝ 9.75 **(05)**




Visit EDUHUB.
Scanned with CamScanner

(b) (i) තාප රසායනික චක්‍රයක් හා දී ඇති දත්ත භාවිතයෙන් පහත ප්‍රතික්‍රියාව සඳහා සම්මත එන්තැල්පි වෙනස්කම ගණනය කරන්න.

$$4\,CH_4(g) + O_2(g) \rightarrow 2\,C_2H_6(g) + 2\,H_2O(g)$$

| | $(\Delta H_f^o)$ (kJ mol$^{-1}$) | $S^o$ (J mol$^{-1}$ K$^{-1}$) |
|---|---|---|
| $CH_4(g)$ | –74.8 | 186.3 |
| $C_2H_6(g)$ | –84.7 | 229.6 |
| $CO_2(g)$ | –393.5 | 213.7 |
| $H_2O(g)$ | –214.8 | 188.8 |
| C(s), graphite | 0.0 | 5.7 |
| $O_2(g)$ | 0.0 | 205.1 |
| $H_2(g)$ | 0.0 | 130.7 |




ප්‍රතික්‍රියාවක් සඳහා ලකුණු ප්‍රදානය කිරීමට ඊතලය දෙපස ඇති සියලුම විශේෂයන්හි භෞතික අවස්ථා, ස්ටොයිකියෝමිතික සංගුණක නිවැරදි විය යුතුය. එවිට එක් එක් විශේෂය සඳහා නිවැරදි ස්ටොයිකියෝමිතික සංගුණක හා නිවැරදි භෞතික අවස්ථාව ඇති විට (ලකුණු 02) බැගින් ප්‍රදානය කරන්න. **(ලකුණු 02x 7 = 14)**


$\Delta H^0_2 = \Delta H^0_1 - \Delta H^0_3$ හෝ $\Delta H_2^0 = \sum \Delta H^0(products) - \sum \Delta H^0(reactants)$ (03)

**(06) (06) (06) (02)**

$\Delta H_2^0$=[-84.7x2 - 214.8x2 - (-74.8x4)] kJ mol$^{-1}$

= -299.8 kJ mol$^{-1}$ **(03+01)**

විකල්ප තාප රසායනික චක්‍රය




ප්‍රතික්‍රියාවක් සඳහා ලකුණු ප්‍රදානය කිරීමට ඊතලය දෙපස ඇති සියලුම විශේෂයන්හි භෞතික අවස්ථා, ස්ටොයිකියෝමිතික සංගුණක නිවැරදි විය යුතුය. එවිට එක් එක් විශේෂය සඳහා නිවැරදි ස්ටොයිකියෝ‍මිතික සංගුණක හා නිවැරදි භෞතික අවස්ථාව ඇති විට (ලකුණු 02) බැගින් ප්‍රදානය කරන්න. **(ලකුණු 02x 7 =**

**(02) (02) (02) (01) (02)**

$\Delta H^0_1$= (-393.5 x 4 -214.8 x 8 – (-74.8 x 4 + 0 x 8)) kJ mol$^{-1}$

= -2993.2 kJ mol$^{-1}$

**(02) (02) (02) (02) (01) (02)**

$\Delta H^0_3$ = ((-393.5 x 4 -214.8 x 8) – (-84.7 x 2 – 214.8 x 2 – 0 x 7)) kJ mol$^{-1}$

= -2693.4 kJ mol$^{-1}$

$\Delta H^0_2 = \Delta H^0_1 - \Delta H^0_3$

= (-2993.2-(-2693.4)) kJ mol$^{-1}$ **(03)**

= -299.8 kJ mol$^{-1}$ **(03+01)**



Visit EDUHUB

Scanned with CamScanner

(ii) ඉහත (b)(i) හි ප්‍රතික්‍රියාව සඳහා සම්මත එන්ට්‍රොපි වෙනස ගණනය කරන්න.

$\Delta S^0 = \sum S^0(products) - \sum S^0(reactants)$ **(04)**

**(02) (02) (02) (02) (01)**

$\Delta S^0 = ((229.6x2 + 188.8x2 - (186.2x4 + 205.1x1))\ J\ mol^{-1}\ K^{-1}$

$= -113.5\ J\ mol^{-1}\ K^{-1}$ **(02+01)**

(iii) 500 K හිදී ඉහත (b)(i) හි ප්‍රතික්‍රියාව සඳහා සම්මත ගිබ්ස් ශක්ති වෙනස ($\Delta G^o$) ගණනය කරන්න.

$\Delta G^0 = \Delta H^0 - T\ \Delta S^0$ **(04)**

$= -299.8\ kJ\ mol^{-1} - (500\ K \times (-113.5 \times 10^{-3})\ kJ\ mol^{-1}\ K^{-1})$ **(04+01)**

$= -243.05\ kJ\ mol^{-1}$ **(02+01)**

(iv) උෂ්ණත්වයෙහි වැඩිවීම ඉහත (b)(i) හි දී ඇති ප්‍රතික්‍රියාවට හිතකර වේ දැයි හේතු දක්වමින් සඳහන් කරන්න. එන්තැල්පි වෙනස හා එන්ට්‍රොපි වෙනස උෂ්ණත්වය මත රඳා නොපවතින බව උපකල්පනය කරන්න.

උෂ්ණත්වය වැඩිකිරීම ඉදිරි ප්‍රතික්‍රියාව සඳහා හිතකර නොවේ. **(03)**

(හෝ උෂ්ණත්වය වැඩි කිරීම ගිබ්ස් ශක්ති වෙනසෙහි ඍන භාවය අඩු කරයි.)

මෙසේ වන්නේ ප්‍රතික්‍රියාව සඳහා ඍන එන්ට්‍රොපි වෙනසක් ඇති නිසාය **(03)**

**සැ.යු.: එන්ට්‍රොපි වෙනසෙහි ලකුණ නිවැරදි නොවන නමුත් පුරෝකථනය එන්ට්‍රොපි වෙනසෙහි ලකුණ සමග එකඟ වේ නම් ලකුණු 06 ප්‍රදානය කරන්න**

**5(b): ලකුණු 75**

6. (a) (i) ජලීය මාධ්‍යයේ සිදුවන **a A(aq) ⇌ b B(aq) + c C(aq)** ප්‍රතිවර්ත්‍ය ප්‍රතික්‍රියාව සලකන්න. ඉදිරි හා පසු පියවර යන දෙකම මූලික ප්‍රතික්‍රියා ලෙස සලකමින් ඉදිරි ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාව ($R_1$) හා පසු ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාව ($R_2$) සඳහා ප්‍රකාශන ලියන්න. ඉදිරි ප්‍රතික්‍රියාව හා පසු ප්‍රතික්‍රියාව සඳහා ශීඝ්‍රතා නියත පිළිවෙළින් $k_1$ හා $k_2$ වේ.

$R_1 = k_1\ [A(aq)]^a$ **(05+01)**

$R_2 = k_2\ [B(aq)]^b\ [C(aq)]^c$ **(05+01)**

[ප්‍රකාශනය ලකුණු 05, භෞතික අවස්ථා ලකුණු 01]

(ii) සමතුලිතතාවේදී $R_1$ හා $R_2$ අතර සම්බන්ධතාව ලියා දක්වන්න.

සමතුලිතතාවේදී, $R_1 = R_2$ **(05)**

(iii) සමතුලිතතා නියතය, $K_C$ සඳහා ප්‍රකාශනය ලියා දක්වන්න. තවද $K_C$, $k_1$ හා $k_2$ අතර සම්බන්ධතාව දෙන්න.

$$K_c = \frac{[B(aq)]^b[C(aq)]^c}{[A(aq)]^a}$$ **(05+01)**

[ප්‍රකාශනය ලකුණු 05, භෞතික අවස්ථා ලකුණු 01]

$$K_C = \frac{k_1}{k_2}$$ **(05)**



Scanned with CamScanner

(iv) ඉහත සමතුලිතතාව හැදෑරීම සඳහා නියත උෂ්ණත්වයකදී පරීක්ෂණ තුනක් සිදු කරන ලදී. මෙම පරීක්ෂණවලදී A, B හා C විවිධ ප්‍රමාණ මිශ්‍ර කර, එම පද්ධතිය සමතුලිතතාවට එළඹීමට ඉඩ හරින ලදී. සමතුලිතතාවේදී පහත දත්ත ලබාගන්නා ලදී.

| පරීක්ෂණ අංකය | සමතුලිතතාවේදී සාන්ද්‍රණය ($mol\ dm^{-3}$) | | |
|---|---|---|---|
| | [A] | [B] | [C] |
| 1 | $1.0 \times 10^{-1}$ | $1.0 \times 10^{-2}$ | $1.0 \times 10^{-3}$ |
| 2 | $1.0 \times 10^{-2}$ | $1.0 \times 10^{-3}$ | $1.0 \times 10^{-3}$ |
| 3 | $1.0 \times 10^{-2}$ | $1.0 \times 10^{-2}$ | $1.0 \times 10^{-5}$ |

I. පරීක්ෂණ 1, 2 සහ 3 සඳහා වගුවෙහි දී ඇති A, B සහ C හි සාන්ද්‍රණ, සමතුලිතතා නියතය සඳහා ඉහත (*a*) (iii) හි ලියන ලද ප්‍රකාශනයට ආදේශ කර සම්බන්ධතා තුනක් ලබාගන්න.

$$K_c = \frac{(1.0\times10^{-2})^b\,(1.0\times10^{-3})^c}{(1.0\times10^{-1})^a} \quad \text{--(1)}$$ **(06)**

$$K_c = \frac{(1.0\times10^{-3})^b\,(1.0\times10^{-3})^c}{(1.0\times10^{-2})^a} \quad \text{--(2)}$$ **(06)**

$$K_c = \frac{(1.0\times10^{-2})^b\,(1.0\times10^{-5})^c}{(1.0\times10^{-2})^a} \quad \text{--(3)}$$ **(06)**

II. මෙම සම්බන්ධතා උපයෝගී කරගෙන a = b = 2c බව ඔප්පු කරන්න.

(1)/(2) => $1 = \frac{10^b}{10^a}$ **(05)**

$10^a = 10^b$

a=b **(05)**

(2)/(3) => $1 = \frac{10^{2c}}{10^b}$ **(05)**

$10^b = 10^{2c}$

b = 2c **(05)**

එම නිසා, a = b = 2c



Scanned with CamScanner

(iv) (II) සඳහා විකල්ප පිළිතුර 1

(iv) (I) හි සමීකරණ (1), (2) හා (3) භාවිතයෙන්

$K_C = 10^{-2b-3c+a}$ ----------(4) (04)

$K_C = 10^{-3b-3c+2a}$ ---------(5) (04)

$K_C = 10^{-2b-5c+2a}$ ---------(6) (04)

Log $K_c$ = -2b-3c+a ---------(7)

Log $K_c$ = -3b-3c+2a ---------(8)

Log $K_c$ = -2b-5c+2a ---------(9)

(4)/(5) or (7)-(8) → a = b (04)

(5)/(6) or (8)-(9) → a = 2c (04)

එම නිසා, a = b = 2c

(iv) (II) සඳහා විකල්ප පිළිතුර 2

(iv) (I) හි සමීකරණ (1), (2) හා (3) භාවිතයෙන්

$K_C = (0.01)^b(0.001)^c(0.1)^{-a}$ ----------(4)

$K_C = (0.001)^b(0.001)^c(0.01)^{-a}$ --------(5)

$K_C = (0.01)^b(0.00001)^c(0.01)^{-a}$ ------(6)

(1)/(2)→ $1 = 10^b \times 10^{-a}$ (05)

$10^a = 10^b$

a=b (05)

(1)/(3) → $1 = 10^{2c} \times 10^{-a}$ (05)

$10^a = 10^{2c}$

a = 2c (05)

එම නිසා, a = b = 2c

III. a, b සහ c යන ස්ටොයිකියෝමිතික සංගුණක සඳහා කුඩාම පූර්ණ සංඛ්‍යා යොදාගනිමින් ඉහත ප්‍රතික්‍රියාවේ සමතුලිතතා නියතය, $K_C$ හි අගය ගණනය කරන්න.

කුඩාම පූර්ණ සංඛ්‍යා කුලකය භාවිතයෙන්

a = 2, b=2, c=1

$K_C$ ගණනය කිරීම

$$K_C = \frac{(1.0\times10^{-2}mol\ dm^{-3})^2(1.0\times10^{-3}mol\ dm^{-3})^1}{(1.0\times10^{-1}mol\ dm^{-3})^2}$$ ((02+01)x3=09)

$K_C = 1.0 \times 10^{-5} mol\ dm^{-3}$ (04+01)

සැ.යු.: $K_C$ සඳහා ලකුණු ප්‍රදානය කිරීමට a, b හා c නිවැරදි විය යුතුය.

**6(a): ලකුණු 80**




Visit EDUHUB
Scanned with CamScanner

(*b*) වායු කලාපයේදී සිදුවන $p\,P(g) \rightleftharpoons q\,Q(g) + r\,R(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.

$p\,P(g) \rightleftharpoons q\,Q(g) + r\,R(g)$ සඳහා එන්තැල්පි වෙනස හා සක්‍රියන ශක්තිය පිළිවෙළින්...

(i) ඉදිරි ප්‍රතික්‍රියාව $p\,P(g) \longrightarrow q\,Q(g) + r\,R(g)$ සඳහා නම් කරන ලද ශක්ති සටහන (ශක්ති... $50.0\ kJ\ mol^{-1}$ හා $90.0\ kJ\ mol^{-1}$ වේ. මෙම ප්‍රතික්‍රියාව සඳහා නම් කරන ලද ශක්ති සටහන (ශක්තිය හා ප්‍රතික්‍රියා ඛණ්ඩාංකය අතර ප්‍රස්තාරය) අඳින්න. P, Q හා R හි ස්ථාන ශක්ති සටහනෙහි සලකුණු කර (*a*) දක්වන්න. තවද, සක්‍රිය සංකීර්ණයෙහි ස්ථානය 'සක්‍රිය සංකීර්ණය' ලෙස එහි සලකුණු කරන්න.




(ii) ආපසු ප්‍රතික්‍රියාව සඳහා සක්‍රියන ශක්තිය ගණනය කරන්න.

ප්‍රතික්‍රියාවෙහි සක්‍රියන ශක්තිය = $E_a$

$E_a = (90.0 - 50.0)\ kJ\ mol^{-1}$ **(05+01)**

$= 40.0\ kJ\ mol^{-1}$ **(04+01)**

(iii) මෙම ප්‍රතික්‍රියාවෙහි සමතුලිතතා නියතය මත උෂ්ණත්වය වැඩිවීමෙහි බලපෑම පැහැදිලි කරන්න.

ප්‍රතික්‍රියාව සඳහා ධන එන්තැල්පි වෙනසක් ඇත. **(05)**
එබැවින් උෂ්ණත්වය වැඩිකිරීමේදී සමතුලිතතා නියතය වැඩි වේ. **(05)**
උෂ්ණත්වය වැඩි කිරීමේදී ආපසු ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතා නියතයට වඩා වැඩි ප්‍රමාණයකින් ඉදිරි ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතා නියතය වැඩි වේ. **(05)**

(iv) I. ඉදිරි ප්‍රතික්‍රියාවෙහි සහ පසු ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතා මත
II. සමතුලිතතා නියතය මත
උත්ප්‍රේරකයක බලපෑම පැහැදිලි කරන්න.

(I) ඉදිරි ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය **(05)**
හා පසු ප්‍රතික්‍රියාවෙහි ශීඝ්‍රතාවය **(05)**
එකම ගුණාකාරයකින් (ප්‍රමාණයකින්) වැඩි කරයි. **(05)**

(II) සමතුලිතතා නියතයෙහි අගය වෙනස් නොවේ. **(05)**

**විකල්ප පිළිතුර**

**(iv) උත්ප්‍රේරකයක් එකතු කිරීම**

(I) ඉදිරි හා පසු ප්‍රතික්‍රියා සඳහා වැඩි අගයන්ගෙන් යුතු ශීඝ්‍රතා නියත **(05)** සහිත අලුත් යන්ත්‍රයක් සපයයි. **(05)**

ඉදිරි හා පසු ප්‍රතික්‍රියාවල ශීඝ්‍රතා නියත අතර අනුපාතය වෙනස් නොවේ. හෝ (ඉදිරි හා පසු ප්‍රතික්‍රියාවල ශීඝ්‍රතා නියත එකම ගුණාකාරයකින් වැඩි වේ.) **(05)**

(II) සමතුලිතතා නියතයෙහි අගය වෙනස් නොවේ. **(05)**

**6(b): ලකුණු 70**



Visit EDUHUB

Scanned with CamScanner

7. (a) ඔබට L, M, N යන ලෝහ කූරු තුන ද $L^{2+}$ (1.0 mol $dm^{-3}$), $M^{2+}$ (1.0 mol $dm^{-3}$), $N^{2+}$ (1.0 mol $dm^{-3}$) යන ද්‍රාවණ තුන ද සපයා ඇත. N ලෝහය $M^{2+}$ අයන ද්‍රාවණයේ ගිල් වූ විට $M^{2+}$, M බවට ඔක්සිහරණය වන අතර, N, $L^{2+}$ අයන ද්‍රාවණයේ ගිල් වූ විට $L^{2+}$, L බවට ඔක්සිහරණය නොවේ.

(i) හේතු දක්වමින්, L, M සහ N යන ලෝහ තුන, ඒවායේ ඔක්සිහාරක හැකියාව වැඩිවන පිළිවෙළට සකසන්න.

$N(s) + M^{2+}(aq) \rightarrow N^{2+}(aq) + M(s)$ ස්වයංසිද්ධ වේ හෝ N(s) මගින් $M^{2+}(aq)$ ඔක්සිහරණය වේ. **(02)**

ඔක්සිහාරක හැකියාව N > M හෝ $[E^0_{N2+(aq)/N(s)} < E^0_{M2+(aq)/M(s)}]$ **(03)**

$N(s) + L^{2+}(aq) \rightarrow N^{2+}(aq) + L(s)$ ස්වයංසිද්ධ නොවේ හෝ N(s) මගින් $L^{2+}(aq)$ ඔක්සිහරණය නොවේ. **(02)**

ඔක්සිහාරක හැකියාව L > N or $[E^0_{L2+(aq)/L(s)} < E^0_{N2+(aq)/N(s)}]$ **(03)**

ඔක්සිහාරක හැකියාව වැඩි වන පිළිවෙල M < N < L ← or L>M>N **(05)**

(හෝ ඔක්සිහාරක හැකියාව වැඩි වන පිළිවෙල L< N < M )

(ii) $L^{2+}(aq)/L(s)$ ඉලෙක්ට්‍රෝඩය හා අනෙක් ඉලෙක්ට්‍රෝඩ දෙකෙන් එක් එක් ඉලෙක්ට්‍රෝඩය භාවිත කර සාදන ලද විද්‍යුත් රසායනික කෝෂ දෙකෙහි විද්‍යුත් ගාමක බලයන් +0.30 V සහ +1.10 V වේ. මෙම තොරතුරු හා ඉහත (i) සඳහා ඔබගේ පිළිතුර භාවිතයෙන් $E^\circ_{M^{2+}(aq)/M(s)}$ සහ $E^\circ_{N^{2+}(aq)/N(s)}$ ගණනය කරන්න. $\left(E^\circ_{L^{2+}(aq)/L(s)} = -0.80\ V\right)$

කෝෂ දෙකෙන් එකක $E_{cell}$ = 0.30 අනිකෙහි $E_{cell}$ = 1.10 V වේ.

වැඩිම $E_{cell}$ අගය $L^{2+}(aq)/L(s)$ ඉලෙක්ට්‍රෝඩය හා $M^{2+}(aq)/M(s)$ ඉලෙක්ට්‍රෝඩය අතර වේ.

අඩුම $E_{cell}$ අගය $L^{2+}(aq)/L(s)$ ඉලෙක්ට්‍රෝඩය හා $N^{2+}(aq)/N(s)$ ඉලෙක්ට්‍රෝඩය අතර වේ.

$E^0_{M2+(aq)/M(s)} - E^0_{L2+(aq)/L(s)} = 1.10\ V$ **(04+01)**

$E^0_{M2+(aq)/M(s)} = 1.10\ V - 0.80\ V = 0.30\ V$ **(04+01)**

සහ

$E^0_{N2+(aq)/N(s)} - E^0_{L2+(aq)/L(s)} = 0.30\ V$ **(04+01)**

$E^0_{N2+(aq)/N(s)} = 0.30\ V + (-0.80V) = -0.50\ V$ **(04+01)**

**සැ.යු.: $E^0$ ලිවීමේදී භෞතික අවස්ථා සදහන් කර නැතත් ලකුණු අඩු නොකරන්න.**

විකල්ප පිළිතුර

ඔක්සිහාරක අනුපිළිවෙළ අනුව කෝෂ දෙකෙහිම ඇනෝඩය $L^{2+}(aq)/L(s)$ වේ.

$E^0_{cathode} - E^0_{L2+(aq)/L(s)} = 1.10\ V$

එම නිසා $E^0_{cathode} = 1.10\ V - 0.80\ V = 0.3\ V$ **(04+01)**

$E^0_{cathode} - E^0_{L2+(aq)/L(s)} = 0.3\ V$

එම නිසා $E^0_{cathode} = 0.3\ V - 0.80\ V = -0.5\ V$ **(04+01)**

එම නිසා,


$E^0_{M2+(aq)/M(s)} = 0.3\ V$ **(04+01)**

$E^0_{N2+(aq)/N(s)} = -0.5\ V$ **(04+01)**



Visit EDUHUB
Scanned with CamScanner

(iii) ඔබට පහත සඳහන් සැකසුම සපයා ඇති අතර එහි L සහ N ලෝහ කූරු දෙක අතර විභවමානයක් සම්බන්ධ කර ඇත.




I. විභවමානයේ පාඨාංකය ගණනය කරන්න.

II. විභවමානය ඉවත් කර L හා N සන්නායකයක් මගින් සම්බන්ධ කළ විට Ⓐ, Ⓑ, Ⓒ සහ Ⓓ යන එක් එක් ඉලෙක්ට්‍රෝඩයේ සිදුවන ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා වෙන් වෙන්ව ලියා දක්වන්න.

විභවමාන පාඨාංකය (P),

$P = E^0_{cell(1)} + E^0_{cell(2)}$ **(05)**

$= (E^0_{M2+(aq)/M(s)} - E^0_{L2+(aq)/L(s)}) + (E^0_{N2+(aq)/N(s)} - E^0_{M2+(aq)/M(s)})$ **(05)**

$= E^0_{N2+(aq)/N(s)} - E^0_{L2+(aq)/L(s)}$ **(05)**

$= -0.50\ V - (-0.80\ V)$

$= 0.30\ V$ **(04+01)**

ධාරාවක් ලබා ගැනීමේදී ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා

(A) ඉලෙක්ට්‍රෝඩය $L(s) \rightarrow L^{2+}(aq) + 2e$ **(05)**


(B) ඉලෙක්ට්‍රෝඩය $M^{2+}(aq) + 2e \rightarrow M(s)$ **(05)**

(C) ඉලෙක්ට්‍රෝඩය $M(s) \rightarrow M^{2+}(aq) + 2e$ **(05)**

(D) ඉලෙක්ට්‍රෝඩය $N^{2+}(aq) + 2e \rightarrow N(s)$ **(05)**

**සැ.යු.: ප්‍රතික්‍රියාවල ⇌ භාවිත කර ඇත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න.**

**7(a): ලකුණු 75**





Visit EDUHUB

Scanned with CamScanner

(b) පහත දැක්වෙන ප්‍රශ්න මැංගනීස් (Mn) මූලද්‍රව්‍යය මත පදනම් වේ.

(i) Mn වල සම්පූර්ණ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

Mn $1s^2 2s^2 2p^6 3s^2 3p^6 3d^5 4s^2$ **(03)**

(ii) Mn වල සුලභ ඔක්සිකරණ අවස්ථා **තුනක්** ලියන්න.

+2, +3, +4, +7 (ඕනෑම තුනක්) **(02 x 3)**

(iii) $MnSO_4 \cdot H_2O$ ජලයේ ද්‍රාවණය කළ විට, **P** ද්‍රාවණය ලබාදෙයි.

I. **P** ද්‍රාවණයේ වර්ණය සඳහන් කරන්න.

II. මෙම වර්ණය ලබාදීමට ඉවහල් වන ප්‍රභේදයේ රසායනික සූත්‍රය සහ IUPAC නාමකරණය දෙන්න.

I. ඉතා ලා රෝස පැහැති/ ලා රෝස පැහැති/ අවර්ණ **(03)**

II. $[Mn(H_2O)_6]^{2+}(aq)$ **(03)**

hexaaquamanganese(II) ion **(03)**

(iv) පහත අවස්ථාවන්හි දී ඔබ නිරීක්ෂණය කරන්නේ කුමක් ද?

I. **P** ද්‍රාවණයට තනුක NaOH දැමූ විට

II. ඉහත (iv)(I) හි ලැබුණු මිශ්‍රණය වාතයට නිරාවරණය කළ විට

III. ඉහත (iv)(I) හි මිශ්‍රණයට සාන්ද්‍ර HCl දැමූ විට

I. සුදු/ ක්‍රීම් පැහැති අවක්ෂේපයක් **(03)**

II. දුඹුරු පැහැති හෝ කළු-දුඹුරු පැහැති අවක්ෂේපයක් **(03)**

III. කහ/ කොළ - කහ ද්‍රාවණයක් **(03)**

(v) Mn වල ඔක්සයිඩ **පහක** රසායනික සූත්‍ර දී, ඉන් එකිනෙකෙහි Mn වල ඔක්සිකරණ අවස්ථාව ලියන්න. එක් එක් ඔක්සයිඩයේ ස්වභාවය භාස්මික, දුබල භාස්මික, උභයගුණී, දුබල ආම්ලික, ආම්ලික ලෙස සඳහන් කරන්න.

| | | | |
|---|---|---|---|
| $MnO$ | +2 | භාස්මික | (02 x 3) |
| $Mn_2O_3$ | +3 | දුබල භාස්මික | (02 x 3) |
| $MnO_2$ | +4 | උභයගුණී | (02 x 3) |
| $MnO_3$ | +6 | දුබල ආම්ලික | (02 x 3) |
| $Mn_2O_7$ | +7 | ආම්ලික | (02 x 3) |

(vi) Mn වල වඩාත්ම සුලභ ඔක්සොඇනායනයේ රසායනික සූත්‍රය දෙන්න.

$MnO_4^-$ **(03)**

(vii) ඔබ ඉහත (vi) හි දැක්වූ ඔක්සොඇනායනය ආම්ලික සහ භාස්මික මාධ්‍යවල ඔක්සිකාරකයක් ලෙස හැසිරෙන ආකාරය පෙන්වීමට තුලිත අර්ධ අයනික සමීකරණ දෙන්න.

ආම්ලික මාධ්‍යයේදී

$MnO_4^-(aq) + 8H^+(aq) + 5e \longrightarrow Mn^{2+}(aq) + 4H_2O(l)$ **(06)**

භාස්මික මාධ්‍යයේදී

$MnO_4^-(aq) + 2H_2O(l) + 3e \longrightarrow MnO_2(s) + 4OH^-(aq)$ **(06)**

(viii) ජල තත්ත්ව පරාමිතීන් නිර්ණයේදී $MnSO_4$ හි **එක්** භාවිතයක් සඳහන් කරන්න.

ජල සාම්පලවල දිය වී ඇති $O_2$ නිර්ණය කිරීම **(03)**
හෝ වින්ක්ලර් ක්‍රමය

**7 (b) : ලකුණු 75**




Visit EDUHUB
Scanned with CamScanner

## C කොටස – රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 150 බැගින් ලැබේ.)

8. (a) P සංයෝගය, පහත දැක්වෙන ප්‍රතික්‍රියා අනුක්‍රමය භාවිත කරමින් V සංයෝගය බවට පරිවර්තනය කරන





(i) Q, R, S, T සහ U සංයෝගවල ව්‍යුහ අඳිමින් සහ පියවර 1–6 සඳහා ප්‍රතිකාරක, පහත දී ඇති ලැයිස්තුවෙ පමණක් තෝරාගෙන ලිවීමෙන්, ඉහත දී ඇති ප්‍රතික්‍රියා අනුක්‍රමය සම්පූර්ණ කරන්න.

**ප්‍රතිකාරක ලැයිස්තුව**
HCHO, Mg/වියළි ඊතර, $H^+/K_2Cr_2O_7$, $PCl_5$, $PBr_3$, $NaNO_2$/තනුක HCl, $H^+/H_2O$

(සැ.යු.: ග්‍රිනාඩ් ප්‍රතිකාරකයක් සමග සංයෝගයක ප්‍රතික්‍රියාව සහ ඉන් ලැබෙන මැග්නීසියම් ඇල්කොක්සයිඩයෙ ජලවිච්ඡේදනය, ඉහත ප්‍රතික්‍රියා අනුක්‍රමයේදී **එක් පියවරක්** ලෙස සැලකිය යුතු ය.)

(ii) P සහ V සංයෝග එකිනෙක සමග ප්‍රතික්‍රියා කළ විට සෑදෙන ඵලයෙහි ව්‍යුහය අඳින්න.

i




(a) (i) ලකුණු 60

* පියවර 04 සඳහා සිසුවා ප්‍රශ්නයේ සඳහන් සටහනෙහි ඇති උපදෙස් වරදවා වටහා ගෙන HCHO සහ $H^+/H_2O$, 1 හා 2 වශයෙන් අනුක්‍රමය නොදක්වා ලියා තිබිය හැක. ලකුණු 11 ප්‍රදානය කරන්න.

ii

$CH_3CH(CH_3)CONHCH(CH_3)CH_3$ (05)


(a) (ii) ලකුණු 05

**8(a): ලකුණු 65**



Visit EDUHUB
Scanned with CamScanner


(b) (i) තුනකට (03) නොවැඩි පියවර සංඛ්‍යාවක් භාවිත කරමින් බෙන්සීන්වලින් *o*-නයිට්‍රෝබෙන්සොයික් අම්ලයෙහි සහ *p*-නයිට්‍රෝබෙන්සොයික් අම්ලයෙහි මිශ්‍රණයක් සාදාගැනීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.





**(b) (i) ලකුණු 34**

නයිට්‍රෝකරණ ප්‍රතික්‍රියාව සඳහා එක් ඵලයක් පමණක් ලියා ඇත්නම් **ලකුණු** 14 ප්‍රදානය නොකරන්න. එසේ වුවත් ඔක්සිකරණ පියවර සඳහා **ලකුණු** 05 ප්‍රදානය කරන්න.


(ii) පහත දැක්වෙන ප්‍රතික්‍රියාවේ, **X** ඵලයේ ව්‍යුහය සහ යාන්ත්‍රණය දෙන්න.




$CH_3COCl + AlCl_3 \longrightarrow CH_3\overset{+}{C}=O$ (04) $\overset{-}{AlCl_4}$ (04) or $CH_3C\equiv\overset{+}{O}$ (04) $\overset{-}{AlCl_4}$ (04)

or $CH_3\overset{+}{C}=O$ (04) $+ \overset{-}{AlCl_4}$ (04) or $CH_3C\equiv\overset{+}{O}$ (04) $+ \overset{-}{AlCl_4}$ (04)




**(b) (ii) ලකුණු 31**


**8(b) : ලකුණු 65**




Visit EDUHUB

Scanned with CamScanner

(*c*) බෙන්සීන්වල ව්‍යුහය නිරූපණය කරනු ලබන්නේ පහත දක්වා ඇති උපකල්පිත සය සාමාජික වලයාකාර (සයික්ලොහෙක්සාට්‍රයිඊන්, cyclohexatriene) දෙකක සම්ප්‍රයුක්ත මුහුමක් ලෙස ය.



පහත දී ඇති සම්මත හයිඩ්‍රජනීකරණ එන්තැල්පි දත්ත භාවිත කරමින්, බෙන්සීන්, උපකල්පිත 'සයික්ලොහෙක්සාට්‍රයිඊන්'වලට වඩා ස්ථායී බව පෙන්වන්න.




$\Delta H^{o} = -120\ \text{kJ mol}^{-1}$

බෙන්සීන් + $3H_2$ ⟶ සයික්ලොහෙක්සේන් $\Delta H^{o} = -208\ \text{kJ mol}^{-1}$

සයික්ලොහෙක්සීන් හි සම්මත හයිඩ්‍රජනීකරණ එන්තැල්පිය = $-120\ \text{kJ mol}^{-1}$


<u>උපකල්පිත, සයික්ලොහෙක්සාට්‍රයිඊන් හි අපේක්ෂිත හයිඩ්‍රජනීකරණ එන් තැල්පිය</u> = $-120 \times 3\ \text{kJ mol}^{-1}$

= $-360\ \text{kJ mol}^{-1}$ (6)

බෙන්සීන්හි සම්මත හයිඩ්‍රජනීකරණ එන්තැල්පිය = $-208\ \text{kJ mol}^{-1}$

<u>බෙන්සීන්හි ස්ථායීතා ශක්තිය</u> (6) = $-152\ \text{kJ mol}^{-1}$ (6)

**හෝ**




සැ.යු. සයික්ලොහෙක්සාට්‍රයිඊන්හි අපේක්ෂිත හයිඩ්‍රජනීකරණ එන්තැල්පිය ගණනය කිරීම සඳහා ලකුණු බෙන්සීන්හි ස්ථායීතා ශක්තිය ගණනය කිරීම සඳහා **ලකුණු** ~~07~~ 10

බෙන්සීන්හි ස්ථායීතා ශක්තිය හයිඩ්‍රජනීකරණ එන්තැල්පි අගයන් දෙක අතර වෙනසට සමාන බව පෙන්වීම සඳහා **ලකුණු** 06. ස්ථායීතා ශක්තිය ගණනයකර නැති නමුත් පහත සඳහන් අයුරු වගන්තියක් මගින් සඳහන් කර ඇත්නම් මෙම **ලකුණු** 06 ප්‍රදානය කළ හැකි.

<u>බෙන්සීන් සහ සයික්ලොහෙක්සාට්‍රයිඊන් යන දෙකම හයිඩ්‍රජනීකරණය වී ($3H_2$ සමග) සයික්ලොහෙක්සේන් ලබා දේ. බෙන්සීන් මෙම ක්‍රියාවලියේදී මුදා හරින ශක්තිය, සයික්ලොහෙක්සාට්‍රයීන් මුදා හරින ශක්තියට වඩා අඩුය. එම නිසා එය වඩා ස්ථායී වේ.</u>

**8(c): ලකුණු 20**




Visit EDUHUB
Scanned with CamScanner

**9.** (*a*) පහත දී ඇති ප්‍රශ්නය කැටායනවල ගුණාත්මක විශ්ලේෂණය මත පදනම් වී ඇත.

**Q** ජලීය ද්‍රාවණයේ **A, B, C** සහ **D** යන ලෝහවල කැටායන **හතරක්** අඩංගු වේ. පහත දී ඇති සටහනේ සඳහන් ප්‍රතික්‍රියාවලට **Q** භාජනය කරනු ලැබේ.

කොටුව තුළ දී ඇති සංකේත මගින් අවක්ෂේපය සහිත ද්‍රාවණ, ඝන ද්‍රව්‍ය හා ද්‍රාවණ නිරූපණය වේ.

(සැ.යු : RT – කාමර උෂ්ණත්වය)




(i) $A_1, A_2, A_3, B_1, B_2, C_1, C_2$, හා $D_1$ යනු **A, B, C, D** කැටායන හතරේ සංයෝග/විශේෂ වේ.

$A_1, A_2, A_3, B_1, B_2, C_1, C_2$, හා $D_1$ හඳුනාගන්න.

(සැ.යු : රසායනික සූත්‍ර **පමණක්** ලියන්න. රසායනික සමීකරණ හා හේතු අවශ්‍ය **නැත**.)



Visit EDUHUB

Scanned with CamScanner

| | |
|---|---|
| $A_1$ | $PbCl_2$ |
| $A_2$ | $PbI_2$ |
| $A_3$ | $PbS$ |
| $B_1$ | $Al(OH)_3$ |
| $B_2$ | $NaAlO_2$ or $AlO_2^-$ or $[Al(OH)_4]^-$ |
| $C_1$ | $ZnS$ |
| $C_2$ | $Zn(OH)_2$ |
| $D_1$ | $SrCO_3$ |

(ලකුණු 08 x 8 = ලකුණු 64)

(ii) සුදු ජෙලටිනීය අවක්ෂේපය (✻) ලබා ගැනීමේදී $NH_4OH/NH_4Cl$ ප්‍රතිකාරකයක් ලෙස භාවිත කිරීම සඳහා හේතුවක් දක්වන්න. (ලකුණු 75 යි)

III කාණ්ඩයේ අයන ($Fe^{3+}$, $Al^{3+}$ and $Cr^{3+}$) හයිඩ්‍රොක්සයිඩ ලෙස අවක්ෂේප කිරීම සඳහා $NH_4OH$ එක් කරනු ලැබේ. (02)

එවිට IV කාණ්ඩයේ ලෝහ අයන ($Zn^{2+}$, $Mn^{2+}$, $Co^{2+}$ and $Ni^{2+}$) වල හයිඩ්‍රොක්සයිඩ ද III වන කාණ්ඩයේ ලෝහ අයනවල හයිඩ්‍රොක්සයිඩ සමග අවක්ෂේප විය හැක. (02)

OH-සාන්ද්‍රණය අඩු කිරීම සඳහා $NH_4Cl$ එකතු කරනු ලැබේ. (පොදු අයන ආවරණය). (02)
හෝ
$NH_4Cl$ එකතු කිරීම $NH_4OH$ හි සමතුලිතතා ස්ථානය වෙනස් කරයි.
$NH_4OH(aq) \rightleftharpoons NH_4^+(aq) + OH^-(aq)$ එබැවින් OH- සාන්ද්‍රණය අඩු වේ.

IV කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල $K_{sp}$ අගය III කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල එම අගයට වඩා විශාල වේ. (02)

එම නිසා $Zn^{2+}$, $Mn^{2+}$, $Co^{2+}$ හා $Ni^{2+}$ වල හයිඩ්‍රොක්සයිඩ ද්‍රාවණයේ තිබියදී $Fe^{3+}$, $Al^{3+}$ හා $Cr^{3+}$ වල හයිඩ්‍රොක්සයිඩ අවක්ෂේප කර ගත හැක. (03)

(ලකුණු 11)

<u>විකල්ප පිළිතුර</u>

$Al^{3+}$ හයිඩ්‍රොක්සයිඩය ලෙස අවක්ෂේප කර ගැනීම සඳහා $NH_4OH$ එක් කරනු ලැබේ. (02)
මෙවිට $Zn^{2+}$ හා $Al^{3+}$ යන දෙකම හයිඩ්‍රොක්සයිඩ ලෙස අවක්ෂේප වේ. (02)

OH-සාන්ද්‍රණය අඩු කිරීම සඳහා $NH_4Cl$ එකතු කරනු ලැබේ. (පොදු අයන ආවරණය). (02)
හෝ
$NH_4Cl$ එකතු කිරීම $NH_4OH$ හි සමතුලිතතා ස්ථානය වෙනස් කරයි.
$NH_4OH(aq) \rightleftharpoons NH_4^+(aq) + OH^-(aq)$ එබැවින් OH- සාන්ද්‍රණය අඩු වේ.
IV කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල $K_{sp}$ අගය III කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල

$K_{sp}$ of $Zn(OH)_2 >$ $Al(OH)_3$ (02)
එබැවින් $NH_4Cl$ / $NH_4OH$ එක් කිරීමෙන් $Zn(OH)_2$ අවක්ෂේප වීම වළක්වාගත හැක. (03)
(ලකුණු 11)

9(a): ලකුණු 75



Scanned with CamScanner

(b) X නම් මිශ්‍රණයක ඇලුමිනියම් සල්ෆයිඩ ($Al_2S_3$) සහ ෆෙරික් සල්ෆයිඩ ($Fe_2S_3$) පමණක් අඩංගු වේ. X හි ඇති $Al_2S_3$ හා $Fe_2S_3$ ස්කන්ධ ප්‍රතිශතයන් ගණනය කිරීමට පහත දැක්වෙන ක්‍රියාපිළිවෙළ යොදාගන්නා ලදී. X මිශ්‍රණයෙන් m ස්කන්ධයක් හයිඩ්‍රජන් වායු ධාරාවක් යටතේදී ඉහළ උෂ්ණත්වයකට රත් කළ විට $Al_2S_3$ නොවෙනස්ව පවතින නමුත්, $Fe_2S_3$ යකඩ (Fe) ලෝහය බවට පරිවර්තනය විය. මෙහි අවසානයේ ලැබුණු ස්කන්ධය 0.824 g විය.

X මිශ්‍රණයෙන් වෙනත් m ස්කන්ධයක් ඉහළ උෂ්ණත්වයකට වාතයේ රත් කළ විට $Al_2S_3$ සහ $Fe_2S_3$ යන දෙකම $SO_2$ වායුව දෙමින් වියෝජනය විය. එම $SO_2$ වායුව, $H_2O_2$ ද්‍රාවණයකට බුබුලනය කර, එකම ඵලය වන $H_2SO_4$ අම්ලය බවට ඔක්සිකරණය කරන ලදී. මෙම සම්පූර්ණ ද්‍රාවණයම සාන්ද්‍රණය 1.00 mol dm$^{-3}$ සම්මත NaOH ද්‍රාවණයක් සමග ෆිනෝල්ප්තලීන් දර්ශකය යොදාගනිමින් අනුමාපනය කළ විට බියුරෙට්ටු පාඨාංකය 36.00 cm$^3$ විය.

(i) හයිඩ්‍රජන් වායුව සමග $Fe_2S_3$ හි ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(ii) $H_2SO_4$ ලබාදීමට $SO_2$ හා $H_2O_2$ අතර ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

(iii) X මිශ්‍රණයේ ඇති $Al_2S_3$ සහ $Fe_2S_3$ ස්කන්ධ ප්‍රතිශතයන් ගණනය කරන්න.

(iv) ඉහත අනුමාපනය සඳහා දර්ශකය ලෙස ෆිනෝල්ප්තලීන් වෙනුවට මෙතිල් ඔරෙන්ජ් භාවිත කළේ නම් බියුරෙට්ටු පාඨාංකයේ වෙනසක් සිදු වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.
(සාපේක්ෂ පරමාණුක ස්කන්ධය : Al=27, S=32, Fe=56)

(ලකුණු 75යි)

(i) $Fe_2S_3 + 3H_2 \rightarrow 2Fe + 3H_2S$ (04)

(ii) $SO_2 + H_2O_2 \rightarrow H_2SO_4$ (04)

(iii) $2Al_2S_3 + 9O_2 \rightarrow 2Al_2O_3 + 6SO_2$ or $Al_2S_3 : SO_2 = 1 : 3$ (03)

$2Fe_2S_3 + 9O_2 \rightarrow 2Fe_2O_3 + 6SO_2$ or $Fe_2S_3 : SO_2 = 1 : 3$ (03)

$H_2SO_4 + 2NaOH \rightarrow Na_2SO_4 + 2H_2O$ or $H_2SO_4 : NaOH = 1 : 2$ (03)

$Al_2S_3$ වල මවුලික ස්කන්ධය = (27x2)+(32x3) = 150 (02)

$Fe_2S_3$ වල මවුලික ස්කන්ධය = (56x2)+(32x3) = 208 (02)

$Al_2S_3$ හි ස්කන්ධය $m_1$ යන $Fe_2S_3$ වල ස්කන්ධ $m_2$ ලෙස සලකා
$H_2$ වායුව යටතේ රත්කල පසු ලැබෙන $Fe_2S_3$ ස්කන්ධය

$$\frac{m_2}{208} \times 56 \times 2$$ (04)

$H_2$ වායුව යටතේ රත්කල පසු ලැබෙන මුළු ස්කන්ධය

$$m_1 + \frac{m_2}{208} \times 56 \times 2 = 0.824g \quad [1]$$ (08)

වාතයේ රත්කළ විට

$Al_2S_3$ වලින් ලැබෙන $H_2SO_4$ මවුල ප්‍රමාණය $= \frac{m_1}{150} \times 3$ (04)

$Fe_2S_3$ වලින් ලැබෙන $H_2SO_4$ මවුල ප්‍රමාණය $= \frac{m_2}{208} \times 3$ (04)

$Fe_2S_3$ හා $Al_2S_3$ වලින් ලැබෙන මවුල ගණන $= \frac{m_1}{150} \times 3 + \frac{m_2}{208} \times 3$ (04)

අනුමාපනය සඳහා වැයවන NaOH මවුල ගණන $= \frac{1}{1000} \times 36$ (02)



Visit EDUHUB

Scanned with CamScanner

අනුමාපනයෙන් ලැබෙන $H_2SO_4$ මවුල ගණන $= \frac{1}{1000} \times \frac{36}{2} = 18 \times 10^{-3}$

$$\frac{3m_1}{150} + \frac{3m_2}{208} = 18 \times 10^{-3}\, g \quad \rightarrow [2]$$

$$m_1 + \frac{m_2}{208} \times 112 = 0.824\, g \quad \rightarrow [1]$$

$$\frac{3m_1}{150} + \frac{3m_2}{208} = 18 \times 10^{-3}\, g \quad \rightarrow [2]$$

$m_1$ හා $m_2$ සඳහා සමීකරණ [1] සහ [2] විසඳමින්

$$\frac{m_1}{50} + \frac{3m_2}{208} = 0.018 \quad \rightarrow [3]$$

$$\frac{m_1}{50} + \frac{3m_2}{208} = 0.018 \quad \rightarrow [3]$$

[3] x 50

$$m_1 + \frac{150m_2}{208} = 50 \times 0.018 \rightarrow [4]$$

[4] - [1]

$$\frac{150m_2}{208} - \frac{112m_2}{208} = 0.900 \times 0.824$$

$m_2 =$ 0.416 g

(02)

$m_2 =$ 0.416 g in eq [1]

$$m_1 + \frac{0.416 \times 112}{208} = 0.824$$

$m_1 =$ 0.600 g

(02)

$$\%m_1 = \frac{0.600}{0.416 + 0.600} \times 100\% = 59.06\%$$ ≃ 59 %.

(04)

$$\%m_2 = 1 - 59.06 = 40.94\%$$ (1 corrected in red to 100) ≃ 41 %

(04)



Visit EDUHUB

Scanned with CamScanner

(iii) සඳහා විකල්ප පිළිතුර 01

$2Al_2S_3 + 9O_2 \rightarrow 2Al_2O_3 + 6SO_2$ or $Al_2S_3 : SO_2 = 1:3$ (03)

$2Fe_2S_3 + 9O_2 \rightarrow 2Fe_2O_3 + 6SO_2$ or $Fe_2S_3 : SO_2 = 1:3$ (03)

$H_2SO_4 + 2NaOH \rightarrow Na_2SO_4 + 2H_2O$ or $H_2SO_4 : NaOH = 1:2$ (03)

$Al_2S_3$ වල මවුලික ස්කන්ධය = (27x2)+(32x3) = 150 (02)

$Fe_2S_3$ වල මවුලික ස්කන්ධය= (56x2)+(32x3) = 208 (02)

$Al_2S_3$ මවුල ගණන $n_1$ සහ $Fe_2S_3$ මවුල ගණන $n_2$ ලෙස සලකමින්

$Fe_2S_3$ වලින් ලැබෙන Fe මවුල ගණන

$n_2 \times 56 \times 2$ (04)

$H_2$ යටතේ රත්කල පසු ලැබෙන මුළු ස්කන්ධය

$150n_1 + 112n_2 = 0.824 \rightarrow [1]$ (08)

අනුමාපනය සඳහා වායුව NaOH මවුල ගණන $= \frac{1}{1000} \times 36$ (02)

අනුමාපනයෙන් ලැබෙන $H_2SO_4$ මවුල ගණන $= \frac{1}{1000} \times \frac{36}{2} = 18 \times 10^{-3}$ (02)

$Al_2S_3$ වලින් ලැබෙන $H_2SO_4$ මවුල ගණන $3n_1$ (04)

$Fe_2S_3$ වලින් ලැබෙන $H_2SO_4$ මවුල ගණන $3n_2$ (04)

මුළු $H_2SO_4$ මවුල ගණන $3n_1 + 3n_2$ (04)

එම නිසා

$3n_1 + 3n_2 = 0.018 \rightarrow [2]$ (08)

$n_1$ සහ $n_2$ සඳහා සමීකරණ [1] සහ [2] විසඳීමෙන්

[2] x 50 $150n_1 + 150n_2 = 0.9 \rightarrow [3]$

[3] –[1] $38n_2 = 0.076$

$n_2 = 2 \times 10^{-3}$ (02)

[2] හි $n_2$ ආදේශයෙන්

$3n_1 + 3 \times 0.002 = 0.018$

$n_1 = 0.004$ (02)



Visit EDUHUB
Scanned with CamScanner

$Al_2S_3$ වල ස්කන්ධය = 0.004 mols x 150 $gmol^{-1}$ = 0.600 g

$Fe_2S_3$ වල ස්කන්ධය = 0.002 mols x 208 $gmol^{-1}$ = 0.416 g

$Al_2S_3$ වල ප්‍රතිශතය $= \frac{0.600}{0.600+0.416} \times 100\% = 59.06$ (04)

$Fe_2S_3$ වල ප්‍රතිශතය $= 100 - 59.06 = 40.94$ (04)

**(iii) සඳහා විකල්ප පිළිතුර 02**

$2Al_2S_3 + 9O_2 \rightarrow 2Al_2O_3 + 6SO_2$ or $Al_2S_3 : SO_2 = 1:3$ (03)

$2Fe_2S_3 + 9O_2 \rightarrow 2Fe_2O_3 + 6SO_2$ or $Fe_2S_3 : SO_2 = 1:3$ (03)

$H_2SO_4 + 2NaOH \rightarrow Na_2SO_4 + 2H_2O$ or $H_2SO_4 : NaOH = 1:2$ (03)

$Al_2S_3$ වල මවුලික ස්කන්ධය = (27x2)+(32x3) = 150 (02)

$Fe_2S_3$ වල මවුලික ස්කන්ධය = (56x2)+(32x3) = 208 (02)

0.824 g වල ඇති $Al_2S_3$ ස්කන්ධය $y$ ලෙස සලකමින්

$n_{Fe} = \frac{(0.824-y)}{56} mol$ (06)

$n_{Fe_2S_3} = \frac{1}{2}\frac{(0.824-y)}{56} mol$ ———— [1] (06)

$n_{SO_2} = 3 \times \frac{y}{150} + 3 \times \frac{1}{2}\frac{(0.824-y)}{56} mol$ (10)

අනුමාපනයෙන් ලැබෙන NaOH මවුල ගණන $= \frac{1}{1000} \times 36 mol$ (02)

අනුමාපනයෙන් ලැබෙන $H_2SO_4$ මවුල ගණන $= \frac{1}{1000} \times \frac{36}{2} = 18 \times 10^{-3} mol$ (02)

එම නිසා $n_{SO_2} = 0.018 mol$

$n_{SO_2} = 3 \times \frac{y}{150} + 3 \times \frac{1}{2}\frac{(0.824-y)}{56} = 0.018$ ——— [2] (10)

$y$ සඳහා සමීකරණය [2] විසඳීමෙන්

$$\frac{y}{150} + \frac{(0.824-y)}{112} = 0.006$$

$$112y + 150(0.824-y) = 0.006 \times 150 \times 112$$



Visit EDUHUB

Scanned with CamScanner

$$38y = 22.8$$

$$y = m_{Al_2S_3} = 0.60\,g$$ (02)

y = 0.60 g [1] සමීකරණයේ ආදේශයෙන්

$$n_{Fe_2S_3} = \frac{1}{2}\frac{(0.824-0.60)}{56}mol = 0.002\,mol$$

$$m_{Fe_2S_3} == 0.002\times 208\,g\,mol^{-1} = 0.416\,g$$ (02)

එමනිසා

$Al_2S_3$ ස්කන්ධ ප්‍රතිශතය $= \frac{0.600}{0.600+0.416}\times 100\% = (59\%)$ (04)

$Fe_2S_3$ ස්කන්ධ ප්‍රතිශතය $= 100\% - 59.06\% = (41\%)$ (04)

සැ.යු. පියවර එකතුකර ඇත්නම් ඒ අනුව ලකුණු ප්‍රදානය කරන්න.

**(iv)** නැත (02)

ප්‍රබල අම්ල ප්‍රබල භස්ම අනුමාපනයක් නිසා (02)


මීතයිල් ඔරේන්ජ් සහ පිනොල්ප්තලීන් දෙකෙහිම වර්ණ විපර්යාස සිදුවන pH පරාසය අනුමාපන වක්‍රයේ සිරස් කොටස මත පිහිටයි. (02)

**9(b): ලකුණු 75**



Visit EDUHUB
Scanned with CamScanner

10. (a) පහත දැක්වෙන ගැලීම් සටහන මගින්, වැදගත් මූලද්‍රව්‍ය/සංයෝග තුනක් වන $P_1$, $P_2$ සහ $P_3$ හි කාර්මික නිස්සාරණය/නිෂ්පාදනය පෙන්නුම් කරයි. අවුරුදු දහස් ගණනකට පෙර අපේ මුතුන් මිත්තන් $P_1$ නිෂ්පාදනය කළ බවට සාක්ෂි ඇත. $M_2$ හි උත්ප්‍රේරකයක් ලෙස $P_1$ භාවිත වේ. $P_3$ පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනයේදී භාවිත වේ.




(i) $M_2$ සහ $M_3$ යන නිෂ්පාදන ක්‍රියාවලි නම් කරන්න. (උදා: $Na_2CO_3$ නිෂ්පාදනය සොල්වේ ක්‍රියාවලිය ලෙස නම් කෙරේ.)

$M_2$ – හේබර් ක්‍රියාවලිය මගින් $NH_3$ නිෂ්පාදනය (02)

$M_3$ – ඔස්වල්ඩ් ක්‍රියාවලිය මගින් $HNO_3$ නිෂ්පාදනය (02)

(ii) $M_1$ ක්‍රියාවලිය හඳුනාගෙන, එහි අපවායුවේ ප්‍රධාන සංඝටකය නම් කරන්න.

$M_1$ – Fe නිස්සාරණය (02)

$N_2$ වායුව (02)

(iii) $M_1$ හි භාවිත වන $R_1$, $R_2$ සහ $R_3$ යන අමුද්‍රව්‍යවල සාමාන්‍ය නම් දෙන්න.
(සැ.යු : $R_1$ ශක්ති ප්‍රභවයක් ලෙස මෙන්ම ඔක්සිහාරකයක් ලෙස ද $M_1$ හි ක්‍රියාකරයි; $R_2$ යනු $P_1$ ලබාගැනීම සඳහා භාවිත කළ හැකි ස්වභාවිකව පවතින ප්‍රභවයකි.)

$R_1$ – කෝක්/ ගල් අඟුරු (02)

$R_2$ – යකඩ අඩංගු ලෝපස් යපස් (ලෝපස් සඳහා මෙවර පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) හිමටයිට් (02)

$R_3$ – හුණු ගල් (02)

(iv) $M_1$ ක්‍රියාවලියේදී ඔක්සිහාරකයක් ලෙස $R_1$ හි කාර්යය සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

ඔක්සිකාරකයක් ලෙස : $FeO(s) + C(s) \rightarrow Fe(l) + CO(g)$ (02)

හෝ

$CO_2(g) + C(s) \rightarrow 2CO(g)$

හෝ

$2FeO(s) + C(s) \rightarrow 2Fe(l) + CO_2(g)$

(v) $R_4$ සහ $R_5$ හඳුනාගන්න.

R4 – $N_2(g)$ (02)

R5 – $H_2(g)$ (02)



Visit EDUHUB
Scanned with CamScanner

(vi) $M_1, M_2$ සහ $M_3$ ක්‍රියාවලියන්හි සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න. තිසි තත්ත්වයන් (උෂ්ණත්වය, පීඩනය, උත්ප්‍රේරක වැනි) අදාළ පරිදි සඳහන් කළ යුතුයි.
(සැ.යු : $M_1$ ක්‍රියාවලිය සඳහා $R_2, P_1$ බවට පරිවර්තනය කරන ප්‍රතික්‍රියා පමණක් දෙන්න.)

M1: $3Fe_2O_3(s) + CO(g) \rightarrow 2Fe_3O_4(s) + CO_2(g)$ (02)

$Fe_3O_4(s) + CO(g) \rightarrow 3FeO(s) + CO_2(g)$ (02)

$FeO(s) + CO(g) \rightarrow Fe(l) + CO_2(g)$ --(A)

$2FeO(s) + C(s) \rightarrow 2Fe(l) + CO_2(g)$ --(B)

(A) හෝ (B) (02)

M2:

$$N_2(s) + 3H_2(g) \underset{400 - 500\ ^oC\ (01)}{\overset{200 - 300\ atm\ (01)}{\rightleftharpoons}} 2NH_3(s) \quad (02)$$

Fe catalyst (01)

$K_2O$ and $Al_2O_3$ promoters (01)

සැ.යු. **200 – 300 atm** අතර ඕනෑම පීඩනයක් හා **400 – 500 °C** අතර ඕනෑම උෂ්ණත්වයක් පිළිගත හැක. භෞතික අවස්ථා සඳහන් කිරීමට අවශ්‍ය නැත.

M3:

$$4NH_3(g) + 5O_2 \underset{Pt\ or\ Pt\text{-}Rh\ catalyst\ (01)}{\overset{800 - 900\ ^oC\ (01)}{\rightleftharpoons}} 4NO + 6H_2O(g) \quad (02)$$

$2NO(g) + O_2 \rightarrow 2NO_2$ (02)

$4NO_2(g) + 2H_2O(l) + O_2(g) \rightarrow 4HNO_3$ (02)

සැ.යු. **800 – 900 °C** අතර ඕනෑම උෂ්ණත්වයක් පිළිගත හැක.
භෞතික අවස්ථා සඳහන් කිරීමට අවශ්‍ය නැත.

(vii) $P_1, P_2$ සහ $P_3$ වල ප්‍රයෝජන දෙක බැගින් දෙන්න (ගැලීම් සටහනේ දක්වා ඇති හා ප්‍රශ්නයේ සඳහන් ඒවාට අමතරව).

P1 – මිශ්‍ර ලෝහ වානේ සෑදීමට/ ඉදිකිරීම් කර්මාන්තයේදී ව්‍යුහවල ශක්තිය සඳහා/ යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදනය. (01 x 2)

P2 – පොහොර නිෂ්පාදනය/ නයිලෝන් නිෂ්පාදනය/ පෙට්‍රෝලියම් කර්මාන්තයේදී බොර තෙල්වල ආම්ලික සංරචක උදාසීන කිරීම/ ජලය හා අප ජලය පිරියම් කිරීම/ ශීතකාරකයක් ලෙස/ රබර් කිරි කැටි ගැසීම වැලැක්වීම. (01 x 2)

P3 – පොහොර නිෂ්පාදය/ නයිට්‍රේට් අවශ්‍ය කර්මාන්ත - පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනයේදී $KNO_3$ හා ඡායාරූප කර්මාන්තයේදී $AgNO_3$ ලෝහ පැස්සීමේදී පෘෂ්ඨ පිරිසිදු කිරීම/රාජ අම්ලය නිපදවීම (01 x 2)

(viii) $M_2$ ක්‍රියාවලිය ඉතා ඉහළ උෂ්ණත්වවලදී පහසුවෙන් සිදු වේ දැයි සඳහන් කරන්න. ඔබේ පිළිතුර $\Delta H, \Delta S$ හා $\Delta G$ අනුසාරයෙන් පහදා දෙන්න.

ප්‍රතික්‍රියාව තාපදායක වේ. $\Delta H$ සෘණ වේ (01)

වායුවල මවුල සංඛ්‍යාව අඩු වේ. $\Delta S$ අඩු වේ.

$\Delta G = \Delta H - T\Delta S$ අනුව (01)

$\Delta S$ සෘණ විට $-T\Delta S$ ධන වේ.

උෂ්ණත්වය වැඩි වන විට ධන ලකුණ සහිත පදය සෘණ ලකුණ සහිත පදය අභිබවා (01)

යන නිසා $\Delta G$ ධන අගයක් ගනී. (01)

එම නිසා ඉහළ උෂ්ණත්වවලදී පහසුවෙන් සිදු නොවේ.

**10(a): ලකුණු 50**



Visit EDUHUB
Scanned with CamScanner

(b) පහත ප්‍රශ්න ප්‍රකාශ රසායනික ධූමිකාව සහ ජල දූෂණය මත පදනම් වේ.

(i) ප්‍රකාශ රසායනික ධූමිකාව ඇතිවීමට අවශ්‍යවන ප්‍රධාන වායුමය රසායනික දූෂක වර්ග සහ තත්ත්වයන් සඳහන් කරන්න.

$NO_x$ (NO or $NO_2$), වාෂ්පශීලී කාබනික ද්‍රව්‍ය (VOC), සූර්යාලෝකය/සූර්ය විකිරණ,

15 °C ට වඩා ඉහළ උෂ්ණත්වය. (02 x ...

(ii) උදෑසන සහ සවස් කාලයේ ප්‍රකාශ රසායනික ධූමිකාවේ ප්‍රබලතාව අඩු ඇයිදැයි සඳහන් කරන්න.

ප්‍රකාශ රසායනික ධූමිකාව ඇති වීමට සූර්යාලෝකය අත්‍යවශ්‍ය සාධකයකි. උදෑසන හා සවස් කාලයේ සූර්යා ලෝකයේ ප්‍රභලතාවය අඩු වීම නිසා ප්‍රකාශ රසායනික ධූමිකාවේ ප්‍රභලතාවයද අඩුය. (03

(iii) ප්‍රකාශ රසායනික ධූමිකාව හේතුවෙන් පහළ වායුගෝලයේ ඕසෝන් ඇතිවන ආකාරය තුලිත රසායනික සමීකරණ ආධාරයෙන් පැහැදිලි කරන්න.

$2NO(g) + O_2(g) \rightarrow 2NO2(g)$

$NO_2(g) \rightarrow NO(g) + O^{\cdot}(g)$

$O^{\cdot}(g) + O_2(g) \rightarrow O_3(g)$ (03 x 3

(iv) ප්‍රකාශ රසායනික ධූමිකාවේ ප්‍රධාන ඵල හතරක් (ඕසෝන්වලට අමතරව) සඳහන් කරන්න.

PAN පෙරොක්සි ඇසිටයිල් නයිට්‍රේට්

PAN පෙරොක්සි බෙන්සොයිල් නයිට්‍රේට්

කෙටි දාම (වාශ්පශීලි) ඇල්ඩිහයිඩ

අංශු (අංශුමය ද්‍රව්‍ය) (02 x 4

(v) ප්‍රකාශ රසායනික ධූමිකාවක් ඇති වන අවස්ථාවකදී සෑදෙන මුක්ත ඛණ්ඩක තුනක් සඳහන් කරන්න.

$OH^{\cdot}$ (හයිඩ්‍රොක්සිල් මුක්ත ඛණ්ඩක), $ROO^{\cdot}$(පෙරොක්සි මුක්ත ඛණ්ඩක),

$R^{\cdot}$ (ඇල්කිල් මුක්ත ඛණ්ඩක), $RO^{\cdot}$ (ඇල්කොක්සි මුක්ත ඛණ්ඩක), $O^{\cdot}$ (ඔක්සිජන් මුක්ත ඛණ්ඩක),

NO (02 x 3

(vi) වර්තමානයේ බොහෝ රටවල් විදුලි වාහන භාවිතය දිරිගන්වයි. විදුලි වාහන භාවිතය මගින් ප්‍රකාශ රසායනික ධූමිකාව සෑදීම මත ඇති බලපෑම් සඳහන් කරන්න.

ප්‍රකාශ රසායනික ධූමිකාවට අවශ්‍ය මූලික ද්‍රව්‍ය විද්‍යුත් වාහන මගින් පිට නොවේ. **(02)** එමනිසා විද්‍යුත් වාහන ප්‍රකාශ රසායනික ධූමිකාව අඩු වීමට දායක වේ./ප්‍රකාශ රසායනික ධූමිකාවට දායක නොවේ. (02

(vii) විදුලි වාහන භාවිතය හේතුවෙන්, ප්‍රකාශ රසායනික ධූමිකාවට අමතරව, සමනය විය හැකි පාරිසරික ප්‍රශ්නයක් සඳහන් කරන්න.

ගෝලීය උණුසුම ඉහළ යාම / අම්ල වැසි. (03)



Visit EDUHUB
Scanned with CamScanner

(viii) පහත දැක්වෙන රසායනික ද්‍රව්‍ය රැගෙන යන නෞකාවක් මුහුදේ ගිලුණි.

$Na_2HPO_4$, $HNO_3$, $Pb(CH_3COO)_2$

ඉහත රසායන ද්‍රව්‍ය බැහැරවීමෙන් නැව ආසන්නයේ ඇති ජලයේ ජල තත්ත්ව පරාමිතීන් මත එක් එක් රසායනික ද්‍රව්‍යය මගින් ඇති විය හැකි බලපෑමක් බැගින් සඳහන් කරන්න. (ලකුණු 50 යි)

$PO_4^{3-}$, $NO_3^-$, සුපෝෂණය නිසා ද්‍රාවිත ඔක්සිජන් මට්ටම අඩු වේ.


$HNO_3$ හේතුවෙන් ජලයේ ආම්ලිකතාවය ඉහළයාම/ pH අඩු වීම.

$Pb^{2+}$ - මුහුදු ජලයේ බැර ලෝහ මට්ටම වැඩි වීම/ ජලයේ ලෙඩ් මට්ටම ඉහළ යාම. **(03 x 3)**

**10(b): ලකුණු 50**

(c) පහත සඳහන් ප්‍රශ්න ස්වාභාවික රබර් හා බහු අවයවක ආශ්‍රිත නිෂ්පාදන ද්‍රව්‍ය සඳහා යොදන ආකලන ද්‍රව්‍ය මත පදනම් වේ.

(i) ස්වාභාවික රබර්වල පුනරාවර්ති ඒකකය අඳින්න.




**(10)**

සැ.යු. හතරැස් වරහන් අවශ්‍ය නොවේ. **"n"** ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය නොකරන්න.

(ii) ස්වාභාවික රබර් කිරි කැටිගැසීම වැළැක්වීම සඳහා භාවිත කළ හැකි සංයෝගයක් දෙන්න. **(04)**

$NH_3$ ද්‍රාවණය

(iii) ස්වාභාවික රබර් කිරි කැටි ගැසීම සඳහා භාවිත කළ හැකි සංයෝගයක් සඳහන් කර, එය ක්‍රියාකරන ආකාරය පැහැදිලි කරන්න. **(04)**

ඇසිටික්/ෆෝමික් අම්ලය වැනි අම්ල

H+ වලට COO- කාණ්ඩ උදාසීන කළ හැකි බැවින්, රබර් අංශුවල පෘෂ්ඨය උදාසීන කරයි. අංශු එවිට එකිනෙක හා සම්බන්ධ වී ස්කන්ධයක් ලෙස තැන්පත් වේ. **(02 x 4 = 08)**

(iv) ස්වාභාවික රබර්වල 'වල්කනයිස් කිරීම' සිදු කරන්නේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න. **(03 x 3 = 09)**

රබර් 1-3% සල්ෆර් සමඟ රත් කෙරේ (හෝ 140-160 $^0C$).

(v) වල්කනයිස් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා යොදාගන්නා ද්‍රව්‍ය වර්ග දෙකක් සඳහන් කරන්න.

කාබනික උත්ප්‍රේරක **(03 x 2 = 06)**

උත්ප්‍රේරක වර්ධක හෝ ZnO

(vi) බහු අවයවක භාණ්ඩ නිෂ්පාදනයේදී ආකලන ද්‍රව්‍ය එක් කිරීමෙන් වැඩි කරගත හැකි ගුණාංග තුනක් දෙන්න. (ලකුණු 50 යි)

නම්‍යශීලී බව වැඩි කරයි.

ගිනි ගන්නා සුළු බව අඩු කරයි.

පාරජම්බුල කිරණ මගින් වන හානිය අඩු කරයි.

යාන්ත්‍රික හා/ හෝ භෞතික ගුණ වැඩි කරයි. **(ඕනෑම තුනක්) (03 x 3 = 09)**

**10(c): ලකුණු 50**

WWW.PastPapers.WIKI

Visit EDUHUB



Scanned with CamScanner